# SOME ASPECTS OF MALAYSIAN CULTURE

*By*

PROF. KUSUMA E. KARUNARATNE
BA (Hons.). M A, Ph. D

Malaysia is a multi-ethnic nation consisting of Malays (53.9%), Chinese (34.9%), Indian (10.5%) and others (0.7%). The Malay Peninsular, Penang, Sabah and Sarawak together form Malaysia. According to the present National Cultural Policy of Malaysia the base of National Culture is the culture which is native to this region and Islam, as the official religion of Malaysia plays an important role in the formation of National Culture. In this respect the culture which is native to this country is implied by the term 'Malaysian Culture' in this paper.

The Malaysian culture has a long history. First as a native culture with its animistic beliefs and limited world-view and then being influenced by the Indian cultures (Hindu and Buddhist cultural traits) around 8th and 9th centuries A.D. There is evidence of Indian influence to Malay culture even prior to 8th century A.D. but it does not seem to have had a strong impact. Subsequently the influence of Islam during the 15th century made deeper in-roads into this culture, substantially changing its course. Over the centuries Malaysian culture has acquired various elements from other cultures but without losing its own basic elements.

A study of Malaysian culture must be based on traditional culture as in present Malaysia the majority rural society cherish and preserve such cultural elements.

Customs, traditions and taboos, as well as superstitions and beliefs are evident in Malaysian culture. In considering these elements as a whole we find two outstanding factors which can be considered as main objects in the customs and traditions practised by them.

1. The good health and prosperity of the individual and thereby assuring the well-being of the nation.

2. The unity and goodwill among the people, mutual help and assistance and also an assurance of their obligations and recognition of the traditions handed down by their ancesstors.

# මලයාසියානු සංස්කෘතිය — එහි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් ඇසුරෙන් විමර්ශනයක්

බහුජාතික ජනගහනයකින් සමන්විත මලයාසියානු සමාජය සංස්කෘතික ලක්ෂණ අතින් ද විවිධත්වයක් පෙන්නුම් කරයි. ප්‍රධාන ජාතිය ලෙස ගැනෙන මලයානු ජාතිකයන් එරට ජනගහනයෙන් සියයට 53.9 ක් වන අතර ජන සංඛ්‍යාව අතින් දෙවැනි තැන හිමි කර ගන්නා චීන ජාතිකයන්ගේ අනුපාතය සියයට 34.9 ක් වෙයි. ඉන්දියානු ජාතිකයන් සියයට 10.5 ක් වන අතර මලයාසියානු වැසියන් ලෙස ගැනෙන සෙසු ජාතිකයෝ සියයට 0.7 ක් වෙති.[1] මලයා අර්ධද්වීපය, පිනෑං දූපත සහ සබාග්, සරවක් යන ප්‍රාන්ත දෙක ද වර්තමාන මලයාසියානු රජය යටතේ එක ම රටක් ලෙස පවතී. වර්තමාන මලයාසියාව තුළ ජාතික සංස්කෘතිය ලෙස දේශීය ජනයා (භූමි පුත්‍ර) සතු මලයානු සංස්කෘතිය ප්‍රධාන තැන ගනු ලබන අතර සෙසු ජාතීන්ගේ සංස්කෘතික ලක්ෂණ, සිරිත් විරිත් ආදිය පවත්වා ගෙන යාමට ඔවුනට නිදහස ඇත.[2] මේ අනුව මලයාසියාව තුළ පවත්නා ප්‍රධාන සංස්කෘතිය මලයාසියානු සංස්කෘතිය ලෙස මෙහි දී හඳුන්වනු ලැබේ.

මලයාසියානු සංස්කෘතිය සෑහෙන තරම් දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන අතර එම කාල පරිච්ඡේදය තුළ දී විවිධ බලපෑම්වලට හසුව වෙනස් වෙමින් වර්ධනය වූ සංස්කෘතියක් ද වෙයි. මුලින් ම නොදියුණු දේශීය සංස්කෘතියක් වශයෙන් පැවත ආ මෙම සංස්කෘතිය ක්‍රිස්තු වර්ෂයෙන් මුල් ශතවර්ෂ කිහිපය තුළ වරින්වර ඉන්දියානු බලපෑමට හසු විය.[3] ක්‍රි. ව. 8 වන හා 9 වන ශතවර්ෂවල දී සිදු වූ ඉන්දියානු බලපෑම්, විශේෂයෙන් ම හින්දු සංස්කෘතිය, මලයාවේ විවිධ ප්‍රාන්තවල පැතිර යමින් දේශපාලන හා සංස්කෘතික වශයෙන් ද දැඩි බලපෑමක් කළේය.[4] මේ සමග ම බෞද්ධාගමික බලපෑමක් ද සිදු විය. එමගින් දේශීය මලයානු සංස්කෘතික ලක්ෂණ හින්දු හා බෞද්ධ සංස්කෘතික ලක්ෂණ හා සම්මිශ්‍රණය වීමක් දක්නට ලැබිණ.[5] එතැන් පටන් හින්දු සංස්කෘතික අංග විසින් දේශීය සංස්කෘතිය හැඩ ගස්වනු ලැබීමක් ද සිදු විය. සාම්ප්‍රදායික මලයාසියානු සංස්කෘතියේ පැවති ඇතැම් සිරිත් විරිත්, අද දක්වාත් මලයාසියානු ජාතිකයන් විසින් පිළිපදිනු ලබන ඇතැම් චාරිත්‍ර ආදිය හින්දු සංස්කෘතියේ ආභාසයෙන් ලැබුණු ඒවාය.

මලයාසියානු සංස්කෘතිය කෙරෙහි අනතුරුව බලපෑ ප්‍රබල සංස්කෘතිය නම් ඉස්ලාම් ධර්මය පදනම් කරගත් ඉස්ලාම් සංස්කෘතියයි. ක්‍රි.ව. 15 වන සියවස ආරම්භයේ දී ඉස්ලාම් ධර්මය මලයාසියානු සමාජයට ඇතුළු විය.[6] එතැන් පටන් එහි හින්දු සංස්කෘතික ලක්ෂණ තරමක් දුරට යටපත් කරමින් ඉස්ලාම් සංස්කෘතිය ප්‍රචලිත විය. එසේ වුව ද හින්දු සංස්කෘතියේ බලපෑම ලැබීමට පෙර දේශීය මලයාසියානු ජනතාව අතර පැවති සංස්කෘතික ලක්ෂණ මෙන් ම හින්දු බලපෑම ලබා හැඩ ගැසුණු සංස්කෘතික ලක්ෂණ ද මුළුමනින් ම අතුරුදහන් නොවී තව දුරටත් ඉස්ලාම් සංස්කෘතියේ සෙවනෙහි අද දක්වාත් පවතින බව පෙනේ. මේ අයුරින් මලයාසියානු සංස්කෘතිය ගැන විමසීමේ දී සෑහෙන තරම් ඉතිහාසයක් ඇති, විවිධ බලපෑම්වලට ලක් වෙමින්, වෙනස් වෙමින් වර්ධනය වූ සංස්කෘතියක් බව පැහැදිලි වෙයි.

ඉස්ලාම් සංස්කෘතිය මලයාසියානු සමාජය තුළට ඇතුළු වීමේ දී ඒ වන විට එහි මුල් බැස තිබූ හින්දු සංස්කෘතික ලක්ෂණ මිශ්‍ර වූ මලයාසියානු සංස්කෘතිය සෑහෙන තරම් දියුණු සංස්කෘතියක් විය. කෙසේ නමුදු ඉස්ලාම් ධර්මය ප්‍රබල ලෙස එම සමාජය තුළට ඇතුළු වීම හේතු

කොට ගෙන සංස්කෘතික විපර්යාසයක් සිදු වීම නොවැළැක්විය හැකි වුව ද ඉස්ලාම් ධර්මයේ මූලික ඉගැන්වීම්වලට පටහැනි නොවන තරමට එතෙක් පැවැති සංස්කෘතියේ ඇතැම් ලක්ෂණ ද නව සංස්කෘතිය තුළට අන්තර්ගග්‍රහණය වීමක් සිදු වූ බව පෙනේ. නිදසුන් ලෙස ගෙන බලන විට විවාහ චාරිත්‍ර වැනි අංග විෂයෙහි හින්දු චාරිත්‍ර විධි අද දක්වාත් පවතින අයුරු දක්නට ලැබේ.[7]

වර්තමාන මලයාසියානු සමාජයේ මලයානු ජාතිකයන් අතර ඉස්ලාම් ධර්මය ප්‍රධාන ආගම වශයෙන් පවතී. හැම මලයානු ජාතිකයකු ම අවශ්‍යයෙන් ම ඉස්ලාම් භක්තිකයකු විය යුතුය යන අදහස තහවුරු වන තරමට ඔවුහු ඉස්ලාම් භක්තිය දැඩි ව පිළිගනිති කෙසේ වුව ද, මෙහි එක් විශේෂත්වයක්, සබාහ් ප්‍රාන්තයේ වැසියන් (Kadazan) ක්‍රිස්තු භක්තිකයන් වීමෙන් පෙනෙන්ට ඇත. එහෙත් මෙම විශේෂත්වය හැරුණ විට මලයාසියානු සමාජය සමස්තයක් ලෙස ගත් විට එහි ජීවත් වන මලයානු ජාතිකයන් ඉස්ලාම් භක්තිය අදහන ජන කොට්ඨාසයක් ලෙස හඳුනා ගත හැකිය.

මලයාසියානු සංස්කෘතිය විමර්ශනයට ලක් කිරීමේ දී සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කළ යුතු වෙයි. ක්‍රි.ව. 19 වන ශත වර්ෂයේ දෙවන භාගයේ ඉංග්‍රීසි පාලනයට යටත් ව පැවැති මලයාසියාව ක්‍රි.ව. 1957 දී නිදහස් රාජ්‍යයක් බවට පත් වන තෙක් ඉංග්‍රීසි ආධිපත්‍යයට මෙන් ම ඉංග්‍රීසි සංස්කෘතියේ බලපෑමට ද හසු ව පැවති බව පෙනේ. එම අවධිය තුළ දේශීය මලයාසියානු සංස්කෘතිය තුළට ඉංග්‍රීසි සංස්කෘතික ලක්ෂණ අන්තර්ග්‍රහණය වීම ද මඳ වශයෙන් වුව ද සිදු වී ඇත. විශේෂයෙන් ම වර්තමානයේ මලයාසියානු නගරවැසියන්ගේ ජීවන රටාව තුළ මෙම ආභාසයේ ලකුණු දැක ගත හැකිය. ඒ අනුව වර්තමාන මලයාසියානු නාගරික සංස්කෘතිය තුළින් සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණ සොයා බැලීම පහසු කාර්‍ය්‍යයක් නොවන්නේය. අනික් අතට වර්තමාන මලයාසියාවේ ගැමි සමාජය තුළ සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණ වෙනසට භාජන වුව ද, තව දුරටත් එහි මූලික ලක්ෂණ විද්‍යමාන වෙයි. එබැවින් මලයාසියානු සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ විමසීමේ දී එම සාම්ප්‍රදායික පසුබිම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු වන්නේය.

පොදුවේ ගෙන බලන විට සාම්ප්‍රදායික සමාජයේ පැවති සිරිත් විරිත්, ඇදහිලි විශ්වාස යනාදිය එදා සමාජයේ ප්‍රචලිත ව පැවති තරමට වත්මන් සමාජයේ ප්‍රචලිත වී නොතිබීම මලයාසියානු සංස්කෘතිය විෂයෙහි කැපී පෙනෙන ලක්ෂණයකි. බටහිර බලපෑමට හසු ව, සංස්කෘතික විපර්‍ය්‍යාසයකට මුහුණ දුන් වෙනත් සමාජ මෙන් මලයාසියානු සමාජය ද විශේෂයෙන් ම නාගරික සමාජය එම සාම්ප්‍රදායික ලක්ෂණ සිය මුතුන් මිත්තන් අනුගමනය කළ ආකාරයට, අකුරට ම පිළිපැදීමට නොපෙළඹෙයි. සාම්ප්‍රදායික මලයාසියානු සංස්කෘතික ලක්ෂණ යටතේ මෙහි විමසිල්ලට ලක් කෙරෙන ඇතැම් සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස වර්තමාන මලයාසියානු සමාජයෙහි වෙනසට භාජන වී ගොස් හෝ ඇතැම් ඒවා නාගරික සමාජයෙන් සම්පූර්ණයෙන් ම වාගේ තුරන් ව ගොස් හෝ ඇත. එවැනි සංස්කෘතික ලක්ෂණ වර්තමාන මලයාසියානු නගරවැසියන්ට නුහුරු ඒවා වන අතර ගැමි සමාජයේ තව දුරටත් භාවිතයේ පවත්නා ඒවාය. උසස් අධ්‍යාපනය, රැකියා නියුක්තිය, නිදහස් චින්තනය, නාගරිකරණය, විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව යනාදිය මෙම විපර්යාසයනට මුල් වූ සාධක ලෙස සැලකිය හැකිය. කෙසේ නමුත් පොදුවේ බලන විට මලයාසියාවේ ගම්බද පෙදෙස්වල මෙම සිරිත් විරිත් මඳ වෙනස්කම්වලින් යුතුව හෝ අද පවා දක්නට ලැබේ. ප්‍රබල සංස්කෘතියකට අයත් ලක්ෂණ, සමාජයකින් එතරම් පහසුවෙන් ඉවත් කළ නොහැකිය යන සංස්කෘතිය පිළිබඳ පොදු නියාමය මලයාසියානු සමාජය විෂයෙහි ද සාධාරණ වන බව පෙනේ.

අනිත් අතට බලන විට මලයාසියානු සංස්කෘතියේ ප්‍රබල අංගයක් වන ආගම, ඉස්ලාම් ධර්මය එරට සංස්කෘතික විපර්යාසයෙහි අධිවේගයක් වළක්වා ලීම සඳහා පෙරමුණේ සිටී යයි කීම ද අසාධාරණ නොවේ. නගරබද සංස්කෘතිය තුළ ඇතැම් විට සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණවලට පිටුපා යාමේ ප්‍රවණතාවක් ඇති විට පවා යම් ආකාරයක බැඳීමක්, නැතහොත් පසුබෑමක් ආගම වැනි සංස්කෘතික අංග මගින් සිදු වන බව පෙනේ. නිදසුනක් ලෙස විවාහ සංස්ථාව ගතහොත් මලයානු ජාතිකයන්ගේ විවාහයේ දී ආගම අත්‍යවශ්‍ය මෙන් ම ප්‍රබල සාධකයක් ද වන්නේය. විවාහාපේක්ෂක තරුණයා හා තරුණිය අවශ්‍යයෙන් ම ඉස්ලාම් භක්තිකයෝ විය යුතු වෙති. වත්මන් නාගරික තරුණ තරුණියන් කිසියම් විටක එම අවශ්‍යතාව සපුරා ගැන්මට නොහැකි වන විට අන් උපක්‍රමයක් මගින් හෝ එම සුදුසුකම ලබා විවාහය සිදු කිරීමට පෙළඹෙන අයුරු පෙනේ.[8] ඇඳුම් පැළඳුම් හා වෙනත් ඇතැම් සිරිත් විරිත් විෂයෙහි ද නූතන තරුණ පරපුර සාම්ප්‍රදායික රාමුවෙන් මුළුමනින් ම බැහැරට නොයාමට ආගමික නියමයන් බලපවත්වන අයුරු පෙනේ. ඇතැම් සංස්කෘතීන් විෂයෙහි බලපාන ආකාරයට වඩා මලයාසියානු සංස්කෘතිය විෂයෙහි ආගම තදින් බලපාන බව සාම්ප්‍රදායික මලයාසියානු සංස්කෘතික ලක්ෂණ විමසීමේ දී හෙළි වන කරුණකි. ජනතාවගේ මනස තුළ, සිතුම් පැතුම්වල ආගමික ඉගැන්වීම් තහවුරු කරලීම කෙරෙහි එරට සමාජය දැඩි අවධානයක් යොමු කරයි.

නූතන මලයාසියාවේ නාගරික ජනතාව විශ්ව සමාජය තුළ සෙසු ජාතීන් හා පොදු තත්වයකට, සමීප බවකට පත් කරවයි. එසේ වුව ද ඔවුන් සතු සාම්ප්‍රදායික සංස්කෘතික අංග මුලුමනින් ම ඔවුන්ගේ මනසින් බැහැර කළ නොහැකිය. විශේෂයෙන් ම පුද්ගලයාගේ ජීවිතයේ වැදගත් අවස්ථාවල දී තව දුරටත් සම්ප්‍රදායානුකූල ව සිරිත් විරිත් පිළිපැදීමක් දක්නට ලැබේ. සාම්ප්‍රදයික සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස අතුරෙන් ඇතැම් ඒවායේ නිරර්ථකභාවය, ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාව වැනි කරුණු හේතු කොට ගෙන, විශේෂයෙන් ම නාගරික ජනයාගේ ජීවිතයෙන් එවැනි ඇතැම් සිරිත් විරිත් ගිලිහී යාම ස්වාභාවිකය. එහෙත් ගැමී ජනතාවගේ මනසින් ඒවා පහසුවෙන් ඉවත් කළ නොහැකි වන ආකාරය මලයාසියානු සමාජයෙන් දැක ගත හැකි ය.

වෙනත් ජාතීන් මෙන් මලයාසියානු ජාතිකයන් ද ජීවිතයේ විවිධ අවස්ථාවල දී පිළිපදින සිරිත් විරිත් සමූහයක් ඇත. උපත, විවාහය, මරණය, වැනි ප්‍රධාන අවස්ථාවල දී මෙන් ම ඊට සම්බන්ධ වූ සෙසු අවස්ථාවල දී ද ඔවුහු විවිධ සිරිත් විරිත් පිළිපදිති. සෙසු ජාතීන් මෙන් මලයාසියානු ජාතිකයන් අතර ද, එම සිරිත් විරිත් හා බැඳුණ විවිධ ඇදහිලි විශ්වාස පද්ධතියක් දක්නට ලැබේ. මොවුන් සතු ඇදහිලි විශ්වාස විෂයෙහි වඩාත් පුළුල් ක්ෂෙත්‍රයක් මතු වී පෙනෙයි. ශතවර්ෂ ගණනාවක් තුළ පැවතෙමින් අවුත් වර්තමානයේ යම් තරමක් දුරට යටපත් වී ගිය ද එම ජාතිකයන්ගේ සිත් සතන් තුළින් මුළුමනින් ම බැහැර නොවූ විවිධ ඇදහිලි විශ්වාස හා තහංචි රැසක් පිළිබඳ සාක්ෂි විද්‍යමාන වෙයි. මේවා ඔවුන්ගේ ජීවිතයේ නොයෙක් අවස්ථාවලට, පුද්ගලයාගේ දෛනික ජීවිතයේ විවිධ ක්‍රියා හා හැසිරීම්වලට සම්බන්ධ වී පවතී.

මලයාසියානු සංස්කෘතියේ සාම්ප්‍රදයික සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස තුළින් ප්‍රකට වන පරමාර්ථ විමර්ශනයේ දී හෙළි වන මූලික ලක්ෂණ ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදා දැක්විය හැකිය. පුද්ගලයාගේ මනා සෞඛ්‍යය, යහපත හා සෞභාග්‍යය උදා කරවීමෙන් ජාතියේ මනා පැවැත්ම, වැඩි දියුණුව අපේක්ෂා කිරීම එයින් පළමුවැන්නයි. අනික් අතට පුද්ගලයන් අතර එකමුතු බව, සාමූහිකත්වය, අන්‍යොන්‍ය සහයෝගීතාව මෙන් ම සම්ප්‍රදායානුකූල වීම, ආගමික නැඹුරුව යන මේවාට අනුබල දීම දෙවැනි අංශයයි.

මලයාසියානු සංස්කෘතියේ ඉහත දැක්වූ විවිධ බලපෑම්වල ප්‍රතිඵල විද්‍යමාන වන අතර ම යථෝක්ත බලපෑම්වල ප්‍රතිඵල ලෙස එම සංස්කෘතිය තුළ මුල් බැස ගත් ඇතැම් ලක්ෂණ දේශීය මුහුණුවරක් ගනිමින් හැඩ ගැසුණ ආකාරය ද පෙනේ. හින්දු සංස්කෘතික ලක්ෂණ දේශීය මලයාසියානු සමාජයට ඇතුළු වී අනුවර්තනය වීමක් සිදු වූ අතර පසු අවධියක දී එරට සමාජයට ඇතුළු වූ ඉස්ලාම් භක්තිය තුළ ද එම සංස්කෘතික ලක්ෂණ ලැගුම් ගැන්වීම අපහසු නොවීය. හින්දු දේව විශ්වාසය ඉස්ලාම් ධර්මය යටතේ අල්ලා දෙවියන් වහන්සේ කෙරෙහි තැබූ විශ්වාසය බවට පරිවර්තනය වූ අතර සෙසු අංග ද එම සෙවන යටතේ නිසි තැන් ලැබීය. මලයානු ජනතාවගේ සංස්කෘතියේ ඉතිහාසය පිළිබඳ විමර්ශනයක යෙදුණ රිචඩ් වින්ස්ටඩ් පවසන පරිදි එම ජාතිකයන්ගේ දියුණුවට හා අඛණ්ඩ වර්ධනයට හේතු වී ඇති එක් ලක්ෂණයක් නම් නවාංග පිළිගැනීමටත් ඒ සමග ම පෙර පැවති සංස්කෘතික අංග හැඩ ගස්වා ගැනීමටත් ඔවුන් තුළ පැවති ශක්‍යතාවයි. ඒ අනුව අතීතයේ සිට ඔවුන් දේශීය සංස්කෘතිය තුළ මුල් බැස තිබූ භූත විශ්වාස වෙතින් හින්දු දේව විශ්වාසය දෙසට යොමු වීමක් හා එම අවස්ථා පසු කොට අල්ලා නම් එක ම දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන තත්වයක් කරා පිය මං කිරීමක් දක්නට ලැබේ.[9] එම ගමන් මාර්ගයේ දී ඔවුන් රැස් කර ගත් ඇදහිලි විශ්වාස සම්භාරය ද ඉවත නොලා රැක ගත් ආකාරය ද මෙම සංස්කෘතිය තුළින් විද්‍යමාන වන්නේය. ජනතාවගේ සිත් සතන් තුළ ප්‍රබල වෙනසක් හා ගැටුමක් ඇති නොවෙමින් බාහිර වශයෙන් වූ විපර්‍යාසයක් මගින් ඔවුන් ඉස්ලාම් භක්තිය ප්‍රමුඛ කොට ගත් සංස්කෘතියක් දෙසට නැඹුරු වීමක් සිදු විය.

ඉස්ලාම් ධර්මය මෙම සංස්කෘතිය තුළට ඇතුළු වීමත් සමග එම ජනතාව අතර ආගමික වතාවත් සිදු කළ ආකාරයේ වෙනසක් නිතැතින් ම සිදු විය. හින්දු ආගමික විශ්වාසයට අනුව දේව භක්තිය හා ඒ හා සම්බන්ධ ව කරන වැඳුම පිදුම්වලට වඩා වෙනසක් ඉස්ලාම් භක්තියට අනුව අල්ලා දේවියන් වහන්සේට කරන යාඥවල දක්නට ලැබුණි. හින්දු ආභාසය ලද මලයාසියානු සංස්කෘතිය තුළ වාසනාව හා අවාසනාව පිළිබඳ ව පැවති සංකල්පයේ වෙනසක් ඉස්ලාම් ධර්මයේ බලපෑම් හේතු කොට ගෙන සිදු විය. ඒ අනුව 'හංතු' (Hantu) යන පදයෙන් යක්ෂයා, නැතහොත් දෙවියන් වහන්සේට ප්‍රතිවිරුද්ධ බලවේගය අදහස් කෙරෙයි. එම වචනයෙහි විරුද්ධාර්ථය පළ වන සේ පද පෙරළියකින් යුතුව 'තුහං' (Tuhan) යන යෙදුම දෙවියන් වහන්සේ හැඳින්වීමට යොද ගනු ලැබේ.[10] මෙයින් හැඟෙන පරිදි අශුභ ඵල, නැතහොත් අවාසනාව යක්ෂයාගෙන් උද වන අතර ශුභ ඵල, නැතහොත් වාසනාව උද වන්නේ සර්වබලධාරී අල්ලා දෙවියන් වහන්සේ වෙතින්ය. අවට පරිසරයේ විවිධ වස්තූන්ට අධි–භෞතික බලයක් ආරෝපණය කිරීමට පුරුදු ව සිටි දේශීය මලයානු ජනතාව හින්දු සංස්කෘතියේ බලපෑමෙන් හෝ ඉස්ලාම් භක්තියේ බලපෑමෙන් හෝ එම විශ්වාස හැඩ ගස්වා ගැනීමට මිස මුළුමනින් ම යටපත් කර දමන තත්වයකට නොපිළිපන්හ. හින්දු සංස්කෘතික ලක්ෂණ යටතේ දේව–භූත විශ්වාසය පැවත ගෙන අවුත් ඉස්ලාම් සංස්කෘතියේ ආභාසයෙන් පසුව ද එම ප්‍රභේදය ඔවුන් අතුරෙන් මුලිනුපුටා දැමිය නොහැකි විය. මෙම දීර්ඝ ගමනේ දී පැහැදිලි ව ම පෙනෙන පරිදි මලයාසියානු ජනතාව කිසි විටෙකත් දේව–භූත දෙපක්ෂය, නැතහොත් දෙවියන් වහන්සේ හා යක්ෂයා යන දෙකොටස මිශ්‍ර කර ගැනීමක් නො කළහ. කවර අවධියක දී වුවත්, කවර සංස්කෘතික ආභාසයක දී වුවත් සුභ–අසුභ භේදය පැහැදිලි ව ම වෙන් කොට තබා ගත්හ. දෙවියන් හා භූතයන් කිසි විටෙකත් එක් තැනක ලා සැලකීමක් ඔවුන් අතින් සිදු නොවීය. වර්තමානයේ භාවිත වන, ඉහත දැක් වූ පරිදි පද පෙරළියෙන් පෙන්නුම් කරන වචන දෙකෙහි පවා වෙනස, භේදය පවත්වා ගැනීමේ අභිලාෂය පෙනේ. මලයාසියානු සංස්කෘතිය තුළ අද පවා භූත විශ්වාසය ප්‍රචලිත ව පවතින අතර ඇතැම් භූතයන් කෙරෙහි ගෞරවපූර්වක බියක් දක්වන අවස්ථා ද නැත්තේ නොවේ. පැරණි මලයානු ජාතිකයන් මෙම අදෘශ්‍යමාන බලවේග දැඩි සේ විශ්වාස කළ අතර එම බලවේගවලට කළ හැකි

ආශ්චර්යවත් දේ පිළිබඳ ව ද ඔවුන් තුළ විශ්වාසයක් පැවතුණි. එම බලවේගයනට පුද්ගලත්වාරෝපණය කිරීමත්, ඇතැම් විට පණ ඇති සතකුගේ වේශය ආරෝපණය කිරීමක් ද එකල දක්නට ලැබුණි. උදාහරණයක් ලෙස ගත හොත් වනයට අධිගෘහිත භූතයා මලයානු බසෙහි යෙදෙන 'හරිමවු' (Hari mau) යන පදයකින් හැඳින්වෙන කොටියකු ලෙසින් පෙනී සිටී යයි විශ්වාසයක් පවතී.

ඇතැම් විට ආගමික වතාවත් නිසි පරිදි කලට වේලාවට ඉටු නොකිරීමෙන් දෙවියන් වහන්සේ කෙරෙහි බිය වන තරමට වඩා භූත උවදුරු ගැන සලකා භූතයන් කෙරෙහි වැඩි බියක් දැක්වීමක් ද පෙනෙන්නට තිබේ.[11] පුද්ගලයා විසින් අනිවාර්යයෙන් ම පිළිපැදිය යුතු ආගමික වතාවත් පැහැර හැරීමෙන් දෙවියන් කෙරෙහි ඇති බිය අබිබවා භූත උවදුරුවලට ඇති බිය නැගී සිටින අවස්ථා ඇත. දෙවියන් හා භූතයන්, එසේ නැතහොත් දෙවියන් වහන්සේ හා යක්ෂයා යන බලවේග දෙක සම්මිශ්‍රණය නොවන සේ, එම බලවේග දෙක දරන තැන පිළිබඳ ව්‍යාකූලත්වයක් ඇති නොවන සේ, පැහැදිලි බෙදීමක් පවත්වා ගැනීමට මලයාසියානු ජනතාව හැම විට ම සමත් වී ඇති බව පෙනේ. ඇතැම් විට ප්‍රබල සේ සැලකෙන භූතයන් කිසියම් ආකාරයකින් පිදීමක් කෙරෙන නමුදු දෙවියන් විෂයෙහි කෙරෙන භක්තිපූර්වක යාඥා හා භූතයන්ගෙන් පිහිට පතා කරනු ලබන පූජා කර්ම අතර ද වෙනසක් පවතී. විශේෂයෙන් ම ආරක්ෂක භූත විශේෂයන්ගෙන් පිහිට පතා කෙරෙන වතාවත් ඇති නමුදු දෙවියන් කෙරෙහි, ඉස්ලාම් භක්තිය අනුව අල්ලා දෙවියන් වහන්සේ කෙරෙහි, ඇති දැඩි භක්තිය හා විශ්වාසය සමග සැසඳීමක් එම ක්‍රියාවලියෙහි නොමැත. ඇතැම් විට භූතයන්ගේ සේවය ලබා ගැනීම සඳහා එම බලවේග බිය ගන්වනු වස් අල්ලා දෙවියන්වහන්සේ සිහිපත් කරන අවස්ථා මලයාසියානු ඇදහිලි විශ්වාස අනුව කෙරෙන පූජා කර්මවලින් හෙළි වෙයි. 'මොහොතකට හෝ තොප මෙහි පෙනී නොසිටිය හොත් තොප කරන්නේ දෙවියන් වහන්සේට ද්‍රෝහී වීමකි''[12] යනුවෙන් පවසා භූතයන් බිය ගන්වන අවස්ථා ඇත. මේ අනුව මලයාසියානු සංස්කෘතිය තුළ දෙවියන් වහන්සේ පිළිබඳ විශ්වාසය හා භක්තිය හා සමාන්තර ව භූත විශ්වාසය ද එකිනෙකට පටහැනි නොවන සේ, නිසි තැන් ලබමින් පවත්නා අයුරු දැක ගත හැකිය.

මලයාසියානු සමාජය සතු සාම්ප්‍රදායික සිරිත් විරිත්වලින් මතු වී පෙනෙන ආකල්ප එම සිරිත් විරිත් පිළිපැදීමෙහි දී දක්නට ලැබෙන ආකාරය විමසීම ද මෙහිදී වැදගත් වෙයි. දරු උපතක් මගින් සමාජයට බිහි වන අලුත් පුද්ගලයා ආරක්ෂා කර ගැනීම මෙන් ම එම පුද්ගලයා බිහි කිරීමට මුල් වන මවගේ රැකවරණය ද එක සේ වැදගත් ලෙස සැලකෙයි. ගැබ් ගත් ළඳක විෂයෙහි කෙරෙන වතාවත්, එහි ලා අනුගමනය කරනු ලබන සිරිත් විරිත් හා තහංචි පද්ධතිය යථෝක්ත ආකල්පය මැනවින් ප්‍රකට කරවයි. ගැබිණි මවකගේ දරු ගැබට සත් මසක් පිරීමේ දී ගැබ සකස් කිරීමේ චාරිත්‍රයක් (Melenggang perut) මලයාසියානු සමාජයේ දක්නට ලැබේ.[13] ඉහත දක්වූ පරිදි සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණ අකුරට ම පිළිපැදීමට පෙළඹුණ පැරන්නන් අතර මෙම සිරිත වඩාත් ප්‍රචලිත විය. ප්‍රසූතියට පහසු වන පරිදි කුස තුළ සිටින දරුවාගේ පිහිටීම සකස් කිරීමක් මෙයින් මූලික වශයෙන් අපේක්ෂා කෙරෙන අතර දරුවාටත් මවටත් විපත කරන භූත දෝෂ දුර ලීමේ අනික් වැදගත් පරමාර්ථය ද මෙහි ගැබ් වී ඇත. අලුතෙන් බිහි වන දරුවා රැක ගනිමින්, ඊට උදව් වන මාතෘ තනතුර දරන්නියගේ ද ආරක්ෂාව, යහපත, ශුභ සිද්ධිය සැලසීම මෙම චාරිත්‍රවල යටින් දිවෙන අභිලාෂයයි. මෙම චාරිත්‍රය ඉටු කිරීමේ දී ප්‍රධාන වින්නඹුව (bidan diatas) ප්‍රමුඛ තවත් වින්නඹුවන් දෙදෙනකු අතින් අවශ්‍ය කාර්යයන් ඉටු කෙරෙන අතර එම අවස්ථාව සිහිපත් කරමින් නෑ හිතවතුන් හා අසල්වැසියන් සඳහා භෝජන සංග්‍රහයක් පැවැත්වීම ද අත්‍යවශ්‍ය අංගයක් සේ සැලකෙයි. සාමූහිකත්වය, සුහද බව වර්ධනය කිරීමේ පරමාර්ථය මලයාසියානු සංස්කෘතියේ අන්තර්ගත සියලු

සිරිත් විරිත් විෂයෙහි ම පාහේ කැපී පෙනෙන ලක්ෂණයකි. ඕනෑ ම චාරිත්‍රානුකූල උත්සවයක දී කහබත් සහිත භෝජන සංග්‍රහයක් පැවැත්වීම අත්‍යවශ්‍ය අංගයක් වීම එහි ප්‍රතිඵලයක් ලෙස පෙනේ. වර්තමානයේ පවා මෙම ජාතිකයන්ගේ සෑම චාරිත්‍රයක් ම පාහේ ඉටු කරන අවස්ථාවල දී වත්කමට අනුව උත්සවාකාරයෙන් සිදු කිරීමත් අනිවාර්ය යෙන් ම භෝජන සංග්‍රහයක් පැවැත්වීමත් දක්නට ලැබේ.

පුද්ගලයාගේ දෛනික ජීවිතයේ ක්‍රියාවල දී, හැසිරීම්වල දී, මෙන් ම චාරිත්‍ර වාරිත්‍ර පිළි පැදීමේ දී ද අප්‍රමාණ වූ තහංචිවලට යටත් වීමට ද මෙම ජාතිකයෝ අතීතයේ සිටම පුරුදු වී සිටියහ. වර්තමාන සමාජයේ, විශේෂයෙන් ම නගරාශ්‍රිත ව ජීවත් වන මලයාසියානු ජාතිකයන් අත්‍ර ප්‍රබලව දක්නට නො ලැබුණ ද ගම් වැසියන් අතර අද පවා බොහෝ සාම්ප්‍රදායික තහංචි පිළිපැදීමේ ප්‍රවණතාව දැක ගත හැකිය.

ගැබිණි මවක් සඳහා සමාජය විසින් පනවා ඇති තහංචි විමසිල්ලට ලක් කිරීමේ දී ඇය පසු වන තත්වයට අනුව කායික හෝ මානසික වශයෙන් අනතුරකට, අතවරයකට ගොදුරු විය හැකි දේ ඇයට තහංචි වන ආකාරය පෙනේ. ගැබිණි මවක්, විශේෂයෙන් ම ගැබ මුහුකුරා ගිය අවස්ථාවක පසු වන ස්ත්‍රියක්, ගැඹුරු කාණු හෝ අගල් උඩින් පැන නොයා යුතුය. උස් තැන්වලට නොනැගිය යුතුය.[14] මෙම තහංචියට පිටු පෑව හොත් දරු ගැබ පහත් වීමෙන් ප්‍රසූතිය දුෂ්කර වේය යන්න මෙම තහංචියට පිටුපසින් ඇති විශ්වාස යයි. ශාරීරික වශයෙන් මවගේ හා දරුවාගේ ආරක්ෂාව සැලසීමේ පැහැදිලි පරමාර්ථයක් මෙයින් දිස් වෙයි. ගැබිණි මවක් ක්‍රෝධය හා බිය ඵළවනසුලු සිදුවීම්, දර්ශන ආදියෙන් බැහැර ව සිටිය යුතුය යන්න ද යථොක්ත පරමාර්ථය ම කියාපාන තවත් තහංචියකි. මවගේ ශරීර සෞඛ්‍යය මෙන් ම මානසික තත්වය ද රැක ගැනීම නිරෝගී දරුවකු බිහි වීමට අත්‍යවශ්‍යය යන විද්‍යාත්මක සත්‍යය හා බැඳුණු විශ්වාසයක් පදනම් කරගත් තහංචි ද දක්නට ලැබේ. ගැබිණි මවක් තනි ව නොනිදිය යුතුය. තනි ව සිටින ගැබිණියක අපල ගෙන දෙන භූතයන්ගේ බලපෑම්වලට හසු වේය යන අදහස මතුපිටින් දිස් වන අතර එහි යටින් දිවෙන පරමාර්ථය ඉහත දැක්වූ සත්‍යය හා බැඳී පවතී. හුදකලා බව හේතු කොට ගෙන කෙනකු තුළ බියක්, අසරණ බව පිළිබඳ හැඟීමක් ඇති වන්නට ඉඩ ඇත. විශේෂයෙන් ම ගර්භණී ව සිටීම වැනි අවස්ථාවක තමා ඉදිරියට මුහුණ පාන මොහොත පිළිබඳ බියක්, චකිතයක් ස්ත්‍රියකගේ සිත තුළ ඇති වීම ද ස්වාභාවිකය.

මලයාසියානු සංස්කෘතිය තුළ ඕනෑ ම චාරිත්‍රානුකූල උත්සවයක දී ආගමික ගීතිකා (කුරාන් ග්‍රන්ථයෙන් උපුටා ගත්) ගායනය ද අවශ්‍යයෙන් ම සිදුවන්නකි. ඉස්ලාම් ධර්මය එම සංස්කෘතිය තුළ මුල් බැස තිබීම මීට ප්‍රධාන හේතුවයි. අනික් අතට සමාජ විපර්යාසය සිදු වන වේගයට සමාන්තර ව සාම්ප්‍රදායික සංස්කෘතිය තුළ වෙනස් වීම් සිදු නොවීමට වග බලා ගැනීමක් ලෙස ද මෙය දැක්විය හැකිය. ඒ සමග ම මලයාසියානු ජාතිකයන්ගේ ජීවිතයේ උපතේ සිට මරණය දක්වා ආගමික හැඟීම්, ආගමික භක්තිය වෙළී තිබිය යුතු ආකාරය සිහිපත් කරවීමක් ද මෙයින් සිදු වෙයි.

මලයාසියානු සංස්කෘතිය සතු ඇතැම් ලක්ෂණ හා ඒ පිළිබඳ සමාජ ආකල්ප වෙනත් පෙරදිග සමාජවල ස්වභාවයට සමාන වන තැන් මෙන් ම විෂම වන තැන් ද ඇත. ජීවිතයේ බැරෑරුම් අවස්ථාවල දී ආගම සිහිපත් කරවීම එක් අතකින් එමගින් ලබන මානසික සුවයට ද හේතු වෙයි. සිංහල සමාජය තුළ වුව ද ගැබිණියක වෙනුවෙන් සිදු කෙරෙන පිරිත් සජ්ඣායනය මීට නිදසුනකි. ගැබිණි මවක් තමා ගර්භණී ව සිටින කාල සීමාව තුළ දී වාම් තැන්පත් පෙනුමක් ඇති ව සිටීම සාම්ප්‍රදායික සිංහල සංස්කෘතිය තුළ දක්නට ලැබෙන, සමාජය අපේක්ෂා කරන ලක්ෂණයකි. වර්තමාන සිංහල සමාජයේ, විශේෂ-

යෙන් ම නාගරික සංස්කෘතිය තුළ මෙම ආකල්පය මතු වී නොපෙනුණ ද මෙය සාම්ප්‍රදායික සිංහල සමාජය තුළ දක්නට ලැබුණකි. මලයාසියානු සංස්කෘතියෙහි මේ සම්බන්ධයෙන් පවත්නා ආකල්පය වෙනස්ය. ගැබිණි මවක්, තමා වෙනුවෙන් ඉටු කරනු ලබන චාරිත්‍රානුකූල උත්සව අවස්ථාවලට මුහුණ දීමේ දී වර්ණවත් ඇඳුම් පැළඳුම් ඇඳ ඉතා අලංකාර ලෙස සැදී පැහැදී සිටිය යුතුය යන විශ්වාසය පවතී. ගැබිණියක තුළ ශාරීරික, හා මානසික වශයෙන් විඩාපත්, මලානික පෙනුමක් දිස් වීම නිසා එවැන්නවුන්ට වින කිරීමට සැරසී සිටින භූතයන්ගේ බලපෑමට ඇය පහසුවෙන් ලක් වන්නට ඉඩ ඇත යන හැඟීම මෙම විශ්වාසයට පාදක හේතුව ලෙස සිතන්නට ඉඩ ඇත. ගැබ සකස් කිරීමේ අවස්ථාවේ දී ගැබිණි මව, චාරිත්‍රානුකූල ව කෙරෙන ස්නානයට පෙරත් පසුවත් ඉතා අලංකාර ලෙස හැඳ පැළඳ සිටීම අත්‍යවශ්‍ය සේ සැලකේ. වර්ණවත්, පැහැපත් පෙනුම අලංකාරය හා දීප්තිය පුද්ගලයා මානසික වශයෙන් හැඟීම් අතින් ඉහළ තත්වයකට, ධෛර්ය සම්පන්න තත්වයකට පත් කරවති'යි යන විශ්වාසය ද මෙහි අන්තර්ගත වේ යයි සිතිය හැකිය.

දරු උපතට පෙර විශේෂ ආරක්ෂාව හා සැලකිල්ල යටතේ රැක බලා ගනු ලබන ගැබිණි මවගේ දරු ප්‍රසූතිය සඳහා සූදානම් වීම ද පියවර කිහිපයකින් සමන්විත චාරිත්‍ර චාරිත්‍ර පද්ධතියක් හා බැඳී පවතී. දරු ප්‍රසූතිය සඳහා නිවසේ සුදුසු ස්ථානයක් තෝරා ගැනීම ද සාම්ප්‍රදායික චාරිත්‍රානුකූල ව වින්නඹුව විසින් ඉටු කරනු ලැබේ. හුදෙක් විද්‍යාත්මක සත්‍යයන් ම පදනම් කර නොගත්ත ද මිථ්‍යා විශ්වාසයනට මුල් තැන දෙමින් එම චාරිත්‍රය ඉටු කිරීමට සාම්ප්‍රදායික මලයාසියානු සමාජය යොමු වූ බව පෙනේ. වර්තමානයේ නාගරික පරිසරය තුළ දියුණු විද්‍යාත්මක වාතාවරණයක සිටින මලයාසියානු වැසියන් දරු ප්‍රසූතිය සඳහා රෝහල්වලට ඇතුළු වීම නිසා එහි ලා සාම්ප්‍රදායික සමාජය අනුගමනය කළ ඇතැම් සිරිත් විරිත්වලට අවකාශ නොලැබී යයි. කෙසේ නමුදු මූලික වශයෙන් දරුවාගේ හා මවගේ ආරක්ෂාව හා යහපත සැලසෙන පරිදි පහසුවෙන් ඉටු කළ හැකි චාරිත්‍ර චාරිත්‍ර ඉටු කිරීමෙහි ලා ඔවුහු පසුබට නොවෙති. අලුත උපන් බිළිඳා නිවසට රැගෙන ගිය පසු සිදු කෙරෙන චාරිත්‍ර, මවක විෂයෙහි සාම්ප්‍රදායික සමාජයේ පිළිගැනුණ සිවු සාළිස් දින තහංචි කාල සීමාව[15] යනාදිය වර්තමානයේ පවා ඇතැමුන් විසින් අනුගමනය කෙරෙන අයුරු දක්නට ලැබේ. මේ අනුව උපත සම්බන්ධයෙන් මලයාසියානු සමාජයේ පිළිපදිනු ලබන හැම සිරිතක් ම මවට හා බිළිඳට පූර්ණ ආරක්ෂාව සැලසීමේ පරමාර්ථය පදනම් කර ගත් බව ප්‍රකට කරුණකි. අලුත් සාමාජිකයාගේ මෙන් ම එම උපතට පිටු දුන් වැඩිහිටි සාමාජිකාවගේ ද පොදුවේ යහපත, ශුභ සිද්ධිය සැලසීමේ මූලික පරමාර්ථය මේ සියල්ලෙන් මතු වී පෙනෙයි.

මලයාසියානු ජාතිකයන් අතර ප්‍රචලිත සිරිත් විරිත් ඔවුන් ලවා අනිවාර්යයෙන් ම පිළිපැද්දවීමේ අධ්‍යාශය කියා පාන උපදේශ පාඨයක් ඔවුන් අතර ව්‍යවහාර වෙයි. 'කලින් තැවී වරද නිවැරදි කර ගැනීම, වරද කර එයින් ගැළවීමට මගක් නොමැති ව පසුතැවිලි වීමට වඩා හොඳය' යන්න එහි අරුතයි. මෙබඳු අදහස් එම සමාජය තුළ තහවුරු වීමෙන් චාරිත්‍ර චාරිත්‍ර පිළිපැද්දවීමට සමාජය එහි ජනතාව යොමු කරවීමක් මෙන් ම එම අදහස් මගින් ජනතාව සම්ප්‍රදාය වෙතට බැඳ තැබීමක් ද සිදු වේ යයි කිව හැකිය.

මලයාසියානු සංස්කෘතියට අයත් චාරිත්‍ර චාරිත්‍ර හා ඇදහිලි විශ්වාස විෂයෙහි මතු වී පෙනෙන තවත් ලක්ෂණයක් මෙහි දී විමසීම වැදගත් වෙයි. මේවා අතුරෙන් ඇතැම් චාරිත්‍ර චාරිත්‍ර හා ඇදහිලි විශ්වාස විද්‍යාත්මක සත්‍යයක් පදනම් කරගත්, තර්කානුකූල ව පිළිගත හැකි ඒවාය. ඇතැම් ඒවා එබඳු සත්‍යයක් පදනම් කර නොගත්, එහෙත් ඉහත දක් වූ මූලික පරමාර්ථ දෙක ඉටු කර ගැනීම දෙසට යොමු වී ඇති ඒවාය. තවත් ඇතැම්

අංග, මෙම දෙකොටසට ම නොගිණිය හැකි, ඇතැම් විට පුද්ගලයාගේ ශුභ සිද්ධිය පතා කරන නමුදු කිසියම් හානියක් සිදු විය හැකි ඒවාය. උදහරණයක් වශයෙන් ගත හොත් දරු උපතකට පසු මවක් සඳහා පවත්නා සිවු සාළිස් දින තහංචි කාල සීමාව තුළ ඇය ගත යුතු ආහාර පෝෂ්‍යදයී ගුණයෙන් හීනය. විද්‍යාත්මක කරුණු අනුව ශරීර සෞඛ්‍යයේ වර්ධනයට හිතකර නොව අහිතකර වන මෙවැනි තහංචි වර්තමාන සමාජය වෙතින් ක්‍රම-යෙන් ඈත් වී යාම පුදුමයක් නොවේ. කෙසේ නමුදු සිරිත් විරිත්, ඇදහිලි විශ්-වාස හා තහංචි විෂයෙහි මෙවැනි අනර්ථකාරී අංග දක්නට ලැබෙන්නේ ඉතා විරල වශ-යෙනි. ප්‍රතිඵල වශයෙන් අනර්ථකාරී වුව ද එවැනි තහංචි පනවා තිබුණේ යහපතක් සිදු කිරීමේ පරමාර්ථයෙනි. එක් අතකින් බලන විට මෙබඳු දුර්වලතා සමාජයේ බුද්ධි මට්ටම පහළ තත්වයක පැවතීමක් ද කියා පාන්නකි.[16]

විශේෂයෙන් ම ගැබ සැකසීම හා දරු ප්‍රසූතිය යන අවස්ථාවල පිළිපදිනු ලබන චාරිත්‍ර අතුරෙන් ඇතැම් ඒවා ඉතා පැරණි අවධියේ මලයානු දේශීය සමාජයේ ප්‍රචලිත ව පැවති ඒවා බව සිතිය හැකිය. හුදෙක් භූත විශ්වාස හා වෙනත් ඇතැම් මිථ්‍යා විශ්වාසවල ස්ව-රූපය එහි දිස් වෙයි. උදහරණයක් ලෙස ගත හොත් ගැබිණියකට ලැබෙන්ට සිටින දරුවා-ගේ ගැහැණු පිරිමි බවට අනාවැකි පළ කිරීම සඳහා ඉටු කෙරෙන චාරිත්‍රයක් ඇත. ගැබ සැකසීමේ චාරිත්‍රය ඉටු කරන අවස්ථාවෙහි දී ම ලෙලි ගැසූ පොල් ගෙඩියක් ඇයගේ කුස මත සත්වරක් සෙමින් පෙරළා සත් වන වර එය බිම පතිත වන්නට සලස්වනු ලැබේ. පොල් ගෙඩිය බිම පතිත වන ආකාරය අනුව දරුවා ගැහැණු දරුවෙක් ද පිරිමි දරුවෙක් ද යන්න දැන ගත හැකි වේ යයි විශ්වාස කෙරේ. පොල්ගෙඩියේ මුහුණත (ඇස් සහිත පැත්ත) උඩට සිටින සේ බිම පතිත වුවහොත් පිරිමි දරුවකු උපදින බවට සාධකය. අනික් අතට හැරී බිමට වැටෙන පොල් ගෙඩිය ගැහැණු දරුවකුගේ උපතට පෙර නිමිත්තකි.

දරු උපත අන් කවර ජාතියකට අයත් පුද්ගලයන්ට මෙන් ම මලයාසියානු ජාතික යන්ට ද අති විශේෂ අවස්ථාවක් වීම අපේක්ෂා කළ හැක්කකි. මෙම විශේෂ අවස්ථාවෙහි දී ඔවුන් පිළිපදින චාරිත්‍රවල තුන් ආකාර මුහුණුවරක් දක්නට ලැබේ. ඈත අතීතයේ විසූ දේශීය මලයානු ජනතාව අතර භාවිත වූ සිරිත්, හින්දු සංස්කෘතියේ බලපෑමෙන් ප්‍රභවය ලත් සිරිත් හා ඉස්ලාම් සංස්කෘතික ලක්ෂණ කියා පාන සිරිත් ද යන අංශ තුනෙහි සම්මිශ්‍රණ යක් පෙන්වන ඇතැම් චාරිත්‍ර විශේෂ දක්නට ලැබේ. උදහරණයක් ලෙස ගත හොත් බිළිඳකු බිහි වූ මොහොතේ දී කරනු ලබන කාර්‍ය්‍ය තුනක් දැක්විය හැකිය. උපන් මොහො-තේ ම වින්නඹුව විසින් බුලත් විටක් හපා බිළිඳාගේ ඇඟට බුලත් කෙළ පහරක් ගසනු ලැබේ. මොළකැටි සිඟිත්තාගේ ළපටි, සියුමැලි බව හා අසරණ බව ද, දුර්වල ස්වභාවය ද අවටින් බැල්ම හෙළා සිටින භූතයන්ට වාසිදයක තත්වයකි. වහා එල්ල විය හැකි එවැනි භූත බලපෑම්වලට ඉඩ නොතබමින් වින්නඹුව ගසන කෙළ පහර දරුවාට ආරක්ෂාව සලසති'යි යන්න දේශීය මලයානු ජාතිකයන් අතර පැවති විශ්වාසයකි.

ඒ සමගම මැටි භාජනයක උලා ගත් කහ දියර ස්වල්පයක් හුණුවලට මිශ්‍ර කර එයින් දරුවාගේ නළල මත කතිරයක සළකුණක් යෙදීම අනික් අවශ්‍ය කාර්‍ය්‍යයකි. අනතුරුව මී පැණි බිඳක් තැවරීමෙන් දරුවාගේ දෙතොල් විවර කිරීමේ චාරිත්‍රයක් ද ඉටු කෙරේ.[17] මෙම කාර්‍ය්‍යයන් දෙකෙහි ම හින්දු සංස්කෘතික ලක්ෂණවල බලපෑමක් දක්නට ලැබේ.

දරු උපතක් සිදු වූ මොහොතේ දී මලයාසියානු ජාතිකයන් විසින් සුපුරුදු ආගමික ගීතිකා (කුරාන් ග්‍රන්ථයෙන් උපුටා ගත්) ගායනය ද පැහැර හරිනු නොලැබේ. දරුවාගේ පියා හෝ මුත්තණුවන් විසින් දරුවා අතට ගෙන ආගමික ගීතිකා, යාඥා ස්වරූපයෙන් ගැයීමක් කරනු ලැබේ. මෙම චාරිත්‍රය විෂයෙහි පැහැදිලි ව ම ඉස්ලාම් සංස්කෘතික ලක්ෂණ

විද්‍යමාන වෙයි. මලයාසියානු සංස්කෘතිය තුළ දීර්ඝ කාලයක් තිස්සේ පැවත ආ සිරිත් විරිත් බාහිර බලපෑම්වල දී අනුවර්තනයෙන් යුතු ව, සම්මිශ්‍රිත ස්වරූපයක් කියා පාමින් අද දක්වාත් පවතින ආකාරය මෙයින් හෙළි වෙයි. සමාජය තුළට ප්‍රබල සංස්කෘතියක් ඇතුළු වීමේ දී එතෙක් පැවති සංස්කෘතික ලක්ෂණ මුලිනුපුටා දැමීමක් සිදු නොවී තව දුරටත් නව සංස්කෘතියේ සෙවණ යටතේ රැඳී පවත්නා ආකාරයට ද ඉහත දක් වූ චාරිත්‍ර නිදසුන් සපයයි. කුමන ආගමික ඉගැන්වීමකින් හෝ කුමන සංස්කෘතියකින් හෝ ගනු ලැබුව ද පොදුවේ පුද්ගලයාගේ රැකවරණය, යහපත, සෞභාග්‍යය උදා කරවීමට සමත් වේයයි සැලකිය හැකි සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස සමාජයක් තුළ නොනැසී පවත්නා ආකාරයට මෙම සංස්කෘතික අංග දෙස් දෙයි.

මේ අයුරින් ආරක්ෂා විධි විධාන හා සුභාශිංසන මධ්‍යයේ බිහි වන දරුවාගේ බිළිඳු විය හා ළමා විය යන කාල පරිච්ඡේද තුළ දී විවිධ චාරිත්‍ර වාරිත්‍ර පද්ධතියකට ඔහු හෝ ඇය ලක් වනු ඇත. මුල් දින කීපය තුළ මව් තුරුළේ සතපවනු ලබන බිළිඳා අනතුරුව තොට්ල්ලේ නිදි කරවීමේ ආරම්භක අවස්ථාව ද (Menaik Buaian) චාරිත්‍රානුකූල ව, යම් තරමක් දුරට උත්සවශ්‍රීයෙන් සිදු කරනු ලැබේ. මෙහි දී ද නොයෙක් විදියේ ඇදහිලි විශ්වාස පෙරටු කොට ගෙන ඉටු කෙරෙන චාරිත්‍ර විධි ඇත. තොට්ල්ල තුළ රැඳී ඇතැයි සැලකෙන භූත බලවේග ඉවත් කර එය දරුවාගේ සැතපීමට ආරක්ෂිත සයනයක් කරවමින් දරුවාගේ අනාගත ශුභ සිද්ධිය ද ඉත සිතින් ප්‍රාර්ථනා කරමින් වින්නඹුව විසින් දරුවා තොට්ල්ල තුළ හොවනු ලබයි. තොට්ල්ල තුළට කලින් දමා තිබූ භාණ්ඩ කීපය අතුරෙන් ඇඹරුම් ගල ඒ හා සමාන සවි ශක්තියක් දරුවාට ලැබේවා'යි කරන ප්‍රාර්ථනයක සංකේතයකි. ඒ තුළ දමා ඇති පහනේ ආලෝකය මෙන් දරුවාගේ අනාගතය දීප්තිමත් ව බැබළිය යුතු යයි අපේක්ෂා කෙරේ. මේ අයුරින් සිය ජනතාව විසින් පරිහරණය කරනු ලබන භාණ්ඩ අතුරෙන් යම් යම් දේ සංකේතාත්මක ව සම්බන්ධ කර ගනිමින් එම භාණ්ඩ වල ඇති බලය, ශක්තිය, දීප්තිය යනාදී ගුණාංග දරුවාට ලැබේවා'යි යන පැතුම ශක්තිමත් නිරෝගී, යහපත්, ජන සමාජයක් පිළිබඳ ප්‍රාර්ථනයක් කියා පායි.

මලයාසියානු සංස්කෘතිය තුළ දක්නට ලැබෙන ඇතැම් චාරිත්‍ර පිළිපදිනු ලබන ආකාරය විමසීමේ දී ඒවායේ මතුපිටින් දෘශ්‍යමාන නොවන අර්ථවත් බවක් දක්නට ලැබේ. අලුත උපන් දරුවාගේ බර කිරීමේ චාරිත්‍රය උත්සවාකාරයෙන් සිදු වන අවස්ථාව මෙහි දී නිදර්ශනයක් ලෙස ගත හැකිය. මෙම චාරිත්‍රය පිළිපැදීමේ දී තරාදියක එක් පසක දරුවා තබා අනිත් පසට සම බරැති බත් (ඇලෙන සේ පිසින ලද කිරිබත් වැනි) ප්‍රමාණයක් දැමිය යුතුය. අනතුරුව රැස්ව සිටින අමුත්තනට එම බත්වලින් සංග්‍රහ කරනු ලැබේ. දරුවාට සුභ පැතීමට පැමිණ සිටින අමුත්තන් එම ආහාර අනුභව කිරීමෙන් දරුවා ශක්තිමත් ව වැඩෙය යන්න මෙම ජාතිකයන් අතර තදින් පැවති විශ්වාසයක් බව පෙනේ. මතු පිටින් හෙළි වන පරිදි එම ක්‍රියාවෙහි හා අපේක්ෂා කරන ප්‍රතිඵලයෙහි තර්කානුකූල සම්බන්ධතාවක් හෝ විද්‍යාත්මක සත්‍යයක් හෝ අර්ථවත් බවක් හෝ නොමැත. එහෙත් මෙවැනි චාරිත්‍රයක් පිළිපැදීමෙහි හා එමගින් නෑ හිත මිතුරන්ට, අසල් වැසියන්ට එක් රැස් වීමට ඉඩ සැලැස්වෙන අවස්ථාවෙහි අර්ථාන්විත ස්වරූපයක් පෙන්නුම් කරයි. පවුලකට අලුතෙන් කෙනකු එක් වූ බව සෙසු අයට දැන ගැනීමට ලැබෙන අවස්ථාවක් ලෙස ද මෙය වැදගත් වෙයි. එවැනි ප්‍රීතිමත් සිදු වීමක දී සාමූහික ව එම ප්‍රීතිය භුක්ති විඳීමෙන් ජනයා අතර එකමුතු බව, සහයෝගීතාව හා සාමූහිකත්වය පිළිබඳ හැඟීම් වර්ධනය වීමට මෙබඳු චාරිත්‍ර වලින් මග පෑදෙන බව නො රහසකි. මලයාසියානු සංස්කෘතියේ මූලික ලක්ෂණ අතර වැදගත් තැනක් දරන සමගිය, සුහද බව, සාමූහිකත්වය යන පරමාර්ථ ඉටු කර ලීමට උදව් වන පරිදි ඔවුන් සතු සිරිත් විරිත් ක්‍රියාත්මක වන ආකාරය මෙබඳු අවස්ථාවක් මගින් ද පැහැදිලි වෙයි.

මලයාසියානු සංස්කෘතිය තුළ සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස සම්බන්ධයෙන් යොද ගනු ලබන භාණ්ඩ, විවිධ උපකරණ හා ද්‍රව්‍ය පිළිබඳ විමසා බැලීම ද මෙහි දී වැදගත් වෙයි. මොවුන් සතු බොහෝ සිරිත් පිළිපැදීමේ දී පිසින ලද බත් (කහ බත් හා ඇලෙන බත්) මෙන් ම සහල් ද වැදගත් වෙයි. ඒ ඒ අවස්ථාවල දී විවිධාකාරයෙන් යොද ගැනීමට මෙන් ම අමුත්තනට සංග්‍රහ කිරීම සඳහාත් පිසින ලද බත් අවශ්‍ය වෙයි. ඉහත දැක්වූ පරිදි දරුවකුගේ බර කිරීමේ චාරිත්‍රය පිළිපැදීම සඳහා ඇලෙන සේ පිසින ලද බත් උපයෝගී කර ගනු ලැබේ. විවාහ චාරිත්‍ර ඉටු කිරීමේ දී අනාගත සහල් පිටි විවාහයට පෙර දින මනාලියගේ නියවල තැවරීමට යොද ගනු ලැබේ.[18] විවාහ මංගලෝත්සවය සඳහා මනාලියගේ නිවසට පැමිණෙන මනාලයා ඇතුළු පිරිස නිවසට ඇතුළු වන පිය ගැට පෙළ පාමුල දී පිළිගනු ලබන්නේ කහ බත් හා සුවඳ පැන් විසුරුවා හැරීමෙනි.[19] කෘෂිකාර්මික සමාජයක් තුළ, කෘෂි ජීවිතයකට හුරු ජනතාවක් විසින් සහල් මෙන් ම එයින් පිසින ලද බත් ද සෞභාග්‍යයේ හා සංවර්ධනයේ සංකේත ලෙස සලකා ශුභ කටයුතු සඳහා මෙන් ම අශුභ දුර ලා යහපත උදා කර ලීමේ අපේක්ෂාවෙන් ද යොද ගනු ලැබීමේ අර්ථවත් බවක් ඇත.

ඇතැම් ඇදහිලි විශ්වාස විෂයෙහි යොද ගනු ලබන අනෙකුත් ද්‍රව්‍ය අතර කහ සහ හුණු ද දක්නට ලැබේ. වෙනත් සමාජවලින් ද මෙම ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් නිදසුන් හමු වෙයි. ඉන්දියානු සමාජය තුළින් හා ලංකා සමාජය තුළින් ද මීට සමාන අවස්ථා සෙවිය හැකිය.

දරු උපතේ දී බිළිඳාගේ නළල මත කහ දියර සහ හුණු මිශ්‍රණයෙන් ලකුණක් යෙදීම මලයාසියානු ජනතාව අතර අතීතයේ දී ප්‍රචලිත ව පැවතුණි. වර්තමානයේ මෙය ගැමි පෙදෙස්වලට සීමා වී ක්‍රියාත්මක වන්නකි. අහිතකර භූතයන්ගේ බැල්ම වැළැක්වීම සඳහා දරු ප්‍රසූතිය අවස්ථාවෙහි ගැබිණි මව රැඳී සිටින කාමරයේ දොර මත හුණුවලින් කතිරයක ලකුණක් යොදනු ලබන අවස්ථාව ද මීට තවත් නිදසුනකි. එක් අතකින් මෙම ද්‍රව්‍යවල ඇති එක්තරා ප්‍රමාණයකට විෂ බීජ මර්දනය කිරීමේ ශක්තිය ඒවා යොද ගැනීමේ දී විද්‍යාත්මක වශයෙන් ද අර්ථවත් බවක් පළ කරයි. ඇතැම් චාරිත්‍ර චාරිත්‍ර ඉටු කිරීමේ දී දෙහි යුෂ මිශ්‍ර වතුර යොද ගැනෙන්නේ ද මීට සමාන අර්ථවත් බවකින් ම විය හැකිය.

සාම්ප්‍රදායික මලයාසියානු සංස්කෘතිය තුළ දක්නට ලැබෙන බොහෝ චාරිත්‍ර ඉටු කිරීමේ දී විශේෂත්වයකින් සැලකෙන, බොහෝ විට අනිවාර්යයෙන් ඇතුළත් විය යුතු තවත් දෙයක් නම් පුවක්ය. විවාහය විෂයෙහි අනුගමනය කරන හැම චාරිත්‍රයක දී ම පාහේ විශේෂ පුවක් බඳුනක් මනාල යුවල අයත් වන දෙපක්ෂය අතර විටින් විට හුවමාරු වන භාණ්ඩ අතර මුල් තැන ගනී. විවාහ ගිවිස ගැනීමේ අවස්ථාව වෙනුවෙන් සාම්ප්‍රදායික ලෙස පුවක් පිළිගැන්වීම සඳහා අවශ්‍ය පුවක් බඳුන ප්‍රධාන තැනක් ගනී. තරුණයා විසින් තරුණියගේ නිවසට තෑගි වශයෙන් ගෙනෙන ලද තෑගි රැස් ව සිටින පිරිස මධ්‍යයේ විවෘත කොට ප්‍රදර්ශනය කර තැබීමේ දී ද එම විශේෂ පුවක් බඳුන මැදින් සිටින සේ පිළියෙල කරනු ලැබේ. එහි දී මූලික චාරිත්‍ර ඉටු කිරීමෙන් පසුව නිවසින් පිට වී යාමට සූදානම් වන තරුණයා ඇතුළු පිරිසට තෑගි වශයෙන් දෙනු ලබන භාණ්ඩ අතර ද විශේෂ පුවක් බඳුන මුල් තැන ගනී.

විවාහ මංගල්‍ය උත්සවයක වැදගත් ම අවස්ථාව ලෙස දැක්වෙන මනාල යුවල ගෞරවාචාර ලැබීම සඳහා මංගල වේදිකාව මත අසුන් ගෙන සිටින අවස්ථාව සඳහා මනාලයාට ඇරයුම් කරනු ලබන්නේ ද විශේෂ පුවක් බඳුනක් පිළිගැන්වීමෙනි. මංගලෝත්සවයට සහභාගි වීමට මනාලියගේ නිවස වෙත පෙරහැරෙන් කැඳවා ගෙන එනු ලබන

මනාලයා එම බඳුනෙන් ගත් පුවක් ගෙඩියක් තම අත්ලෙහි රඳවා ගෙන යා යුතුය. වේදිකාව මත අසුන් ගන්නා තුරු, එහි දී මනාලියට ආහාර කවන මොහොත වන තුරු එය එසේ ම තබා ගත යුතු ලෙස සැලකෙන්නේ එයින් ඔහුට අවශ්‍ය චිත්ත ධෛර්‍ය්‍ය හා කායික ශක්තිය ලැබේය යන විශ්වාසයෙනි. මනාල යුවල ගෞරවාචාර සඳහා මංගල වේදිකාව මත ඉඳ සිටිමින් 'බර්සංඩිං' (Bersanding) නම් චාරිත්‍රය ඉටු කිරීමට මොහොතකට පෙර 'මක් අන්දම්' (Mak Andam) නම් වෙස් ගන්වන ස්ත්‍රිය විසින් තමා විසින් ජප කරන ලද පුවක් කැබැල්ලක් මනාලියට සපන්ට දෙනු ලැබේ. එමගින් ඇයගේ පෙනුම හා අලංකාරය වර්ධනය වීම, චිත්ත ධෛර්‍ය්‍ය වැඩි වීම, මෙන් ම ආරක්ෂාව සැලසීම ද අපේක්ෂා කෙරේ.

සාම්ප්‍රදයික මලයාසියානු සංස්කෘතිය තුළ වැදගත් වන දේ අතුරෙන් පුවක් ප්‍රමුඛස්ථානයක් ගන්නා අයුරු මෙයින් හෙළි වන අතර එමගින් ද වාසනාව, සුභදතාව, මෙන් ම ශක්තිය ළඟා කර දීමක් පිළිබඳ විශ්වාසයක් මෙම ක්‍රියාවට තුඩු දුන් හේතුවක් ලෙස සිතන්නට පුළුවන. මලයාසියාවේ ගැමි ජනයා අතර අද පවා බුලත් සැපීමේ පුරුද්ද පවතී. ඉන්දියානු හා සිංහල සමාජ දෙස බැලුව ද මෙම ලක්ෂණය දක්නට ලැබේ. සිංහල සමාජයේ සාම්ප්‍රදයික චාරිත්‍ර ඉටු කිරීමේ දී බුලත් වැදගත් තැනක් ගනී. මලයාසියානු චාරිත්‍ර අතර බුලත් ද වැදගත් වන අවස්ථා ඇත. දරු උපතක් සිදු වූ මොහොතේ දී වින්නඹුව බුලත් සපා කෙළ පහරක් දරුවා මතට ගැසීමේ ක්‍රියාව එක් නිදසුනකි. මෙහි දී භූත දෝෂ පිළිබඳ විශ්වාසයට අමතර ව බුලත්වල හා පුවක්වල කිසියම් ඖෂධීය ගුණයක් ගැන ද අවධානය යොමු වේ යයි සිතිය හැකිය. ඉස්ලාම් සංස්කෘතික ලක්ෂණයක් ලෙස වර්තමාන මලයාසියානු සංස්කෘතිය තුළ පවා අනුගමනය කෙරෙන බාල වියේ පිරිමි ළමුන් වෙනුවෙන් ඉටු කෙරෙන චර්මච්ඡේද චාරිත්‍රයේ දී ද මීට අදාළ අවස්ථාවක් දක්නට ලැබේ. චර්මච්ඡේදන අවස්ථාවට පෙර දරුවාගේ සිරුරේ වැඩි ශීතල බවක් ඇති කිරීමෙන් වේදනාව අඩුවෙන් දැනවීමේ පරමාර්ථයෙන් දරුවා වැඩි වේලාවක් තුළ ස්නානය කරවීමට සලස්වනු ලැබේ. ස්නානයෙන් පසු ව දියෙන් ගොඩට පැමිණි මොහොතේ ඔහුට බුලත් කොළයක් සැපීමට දෙනු ලබන්නේ ද මොහොතකින් උදා වන වේදනාකාරී අවස්ථාවට නිර්භීත ලෙස මුහුණ දීමට හැකි වන ශක්තිය ලබා ගැනීම සඳහාය.[20]

මලයාසියානු සංස්කෘතික අංග අතුරෙන් විශේෂයෙන් ම ඇදහිලි විශ්වාස විෂයෙහි අතීතයේ පටන් පැවති සර්වාත්මවාදී විශ්වාසවල (animistic beliefs) මුහුණුවර තව දුරටත් දක්නට ලැබේ. ඈත අතීතයේ එහි විසූ ජනතාව ගස්, ගල්, වනාන්තර, කඳු, ගංගා වැනි ස්වභාව ධර්මයේ විශාල වස්තුවල පමණක් නොව ඉතා කුඩා වූ ද හැම අචේතනික වස්තුවක ම පාහේ අදෘශ්‍යමාන බලවේගයක් ඇතැයි විශ්වාස කළහ. ගසක අතු කැපීමේ දී පළමුව සෙමින් ගස සොලවා එහි වසන භූතයන් ඉවත් කර ගස කැපිය යුතු යයි ද ඔවුහු විශ්වාස කළහ. ගලන ගඟක ජල කඳෙහි මෙන් ම කෙනකු ස්නානයෙන් පසුව හිස කෙස්වලින් වැටෙන දිය බිඳුවක ද අදෘශ්‍යමාන බලවේගයක් අරක් ගෙන ඇතැයි ඔවුහු සිතූහ. මේ අයුරින් පුද්ගලයාගේ ජීවිතයේ හැම අවස්ථාවක දී ම, ඔහුගේ සිරුරේ හැම අවයවයක ම භූත බලවේග රැඳී ඇත යන විශ්වාසය මෙම සංසකෘතිය තුළින් විනිවිද පෙනුණ ලක්ෂණයකි. මෙවැනි අදෘශ්‍යමාන බලවේගවලින් යහපත් ප්‍රතිඵල ලබා ගැනීමටත් එමෙන් ම ඒ මගින් සිදු විය හැකි අහිතකර බලපෑම් වෙනත් දේ යොදා ගැනීමෙන් දුරුකර ගැනීමටත් හැකිවන බවට ඔවුන් තුළ විශ්වාසයක් පැවතුණි. යකඩ හෝ එයින් තැනූ ආයුධ මෙසේ ආරක්ෂක භාණ්ඩ ලෙස යොදා ගැනීම මලයාසියානු ජනයා අතර පවතින්නකි. මුල් වරට තොට්ල්ලේ හොවනු ලබන දරුවාගේ පූර්ණ ආරක්ෂාව සඳහා කලින් තොට්ල්ල තුළ දමා තිබූ ගිරය දරුවා එහි සතපවන මොහොතේ දී ඉවත් කර තොට්ල්ල යට තබන්නට ඔවුන් පෙළඹෙන්නේ එම යකඩ ආයුධය භූත බලවේග බිය ගන්වා පලවා හැරීමට සමත් වේය යන විශ්වාසයෙනි.

මේ අයුරින් මලයාසියානු සංස්කෘතියේ චාරිත්‍ර පිළිපැදීමේ දී මෙන් ම විවිධ ඇදහිලි විශ්වාස ක්‍රියාත්මක කිරීමේ දී ද යොදා ගනු ලබන භාණ්ඩ හා ද්‍රව්‍ය සම්බන්ධයෙන් විද්‍යාත්මක වශයෙන් අර්ථවත් බවක් බොහෝ විට තිබෙන අතර හුදු මිථ්‍යා විශ්වාස ස්වරූපය පෙන්වන, එතරම් අර්ථවත් නොවන අවස්ථා ද ඇත. චාරිත්‍රවල දී යොදා ගන්නා විවිධ ද්‍රව්‍ය සංස්කෘතික වශයෙන් වැදගත් බවක් කියා පාන ඒවාය. මලයාසියානු සංස්කෘතිය තුළ දක්නට ලැබෙන සිරිත් විරිත්, ඇදහිලි විශ්වාස හා තහංචි විෂයෙහි අර්ථවත් හා අර්ථවත් නොවන ඒවා දක්නට ලැබෙන්නාක් මෙන් ඔවුන් සිරිත් විරිත් පිළිපැදීමෙහි දී භාවිත කරන භාණ්ඩ හා ද්‍රව්‍ය විෂයෙහි ද මෙම දෙආකාර මුහුණුවර කැපී පෙනේ.

සාම්ප්‍රදායික මලයාසියානු සංස්කෘතියට අයත් විවිධ චාරිත්‍ර වාරිත්‍ර විෂයෙහි මතු වී පෙනෙන තවත් වැදගත් සංස්කෘතික ලක්ෂණ ඇත. විවාහය පුද්ගලයාගේ ජීවිතයේ අත්‍යවශ්‍ය මෙන්ම වැදගත් ම අවස්ථාව ලෙස සැලකීම මලයාසියානු සමාජයට නුහුරු නොවන්නකි. වර්තමානයේ විශේෂයෙන් ම ඉස්ලාම් භක්තියට අනුව පුද්ගලයාගේ විවාහය, ආගමික, සදාචාරාත්මක, සාමාජික, මනෝවිද්‍යාත්මක මෙන් ම කායික වශයෙන් ද වැදගත් වන, එමෙන් ම අත්‍යවශ්‍ය ද වූවකි.[21] විවාහය සම්බන්ධයෙන් වර්තමාන මලයාසියානු සමාජයේ පවත්නා ආකල්පය ද මීට අනුකූල වෙයි. කුරාන් ග්‍රන්ථයෙහි විවාහය සම්බන්ධයෙන් පළ වන අදහස් මලයාසියානු සංස්කෘතිය තුළට ඉස්ලාම් ධර්මය ඇතුළු වීමත් සමග තහවුරු වූ බව සිතිය හැකිය. කුරාන් ග්‍රන්ථයට අනුව අල්ලා දෙවියන් වහන්සේ විසින් අනුමත කරන ලද චාරිත්‍රයක් වන විවාහයට පිටු පාන තැනැත්තා දෙවියන් වහන්සේට ද පිටු පාන්නකු ලෙස සැලකෙන බව මෙහි සඳහන් වෙයි.[22]

වෙනත් බොහෝ සමාජවල සිදු වී ඇති පරිදි මලයාසියාවේ ද වර්තමාන නාගරික සමාජය තුළ විවාහ සංස්ථාව විෂයෙහි සාම්ප්‍රදායික මුහුණුවර ක්‍රම ක්‍රමයෙන් වෙනස් වී ගොස් ඇත.එසේ වුව ද විවාහය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික සමාජය තුළ පැවති ආකල්පය මුළුමනින් ම ගිලිහී ගොස් නැති බව ද ප්‍රකට කරුණකි.

මලයාසියානු සංස්කෘතිය කෙරෙහි බලපෑ හින්දු සංස්කෘතික ලක්ෂණ අතර විවාහ සිරිත් විරිත් ද දක්නට ලැබේ. ඉස්ලාම් ධර්මය එම සමාජය තුළට ඇතුළු වීමත් සමග ඉස්ලාම් ආගමික ඉගැන්වීම්වලට අනුකූල වන සේ විවාහ සංස්ථාව වෙනස් මුහුණුවර ගැනීම සිදු වුව ද පෙර පැවති සිරිත් විරිත් ද එම ඉගැන්වීම්වලට පටහැනි නොවන ලෙස තව දුරටත් පවත්වා ගෙන අවුත් අද දක්වාත් පිළිපදිනු ලබන බව පෙනේ.[23]

සාම්ප්‍රදායික මලයාසියානු සමාජය තුළ දරුවන්ගේ විවාහය දෙමාපිය වැඩිහිටියන් සතු යුතුකමක් හා වගකීමක් ලෙස සැලකුණි. විවාහයේ දී සුදුසු වියේ පසු වන තරුණයකු සඳහා සුදුසු යයි සැලකෙන තරුණියකගේ නිවසට චාරිත්‍රානුකූල ව ගොස් විවාහ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ සිට තරුණිය විවාහ කොට ගෙන ඔහු ආපසු නිවසට පැමිණ අදාළ චාරිත්‍ර ඉටු කරන අවස්ථාව දක්වා පැවැත්වෙන සිරිත් විරිත් මාලාව එම වැඩිහිටියන්ගේ මූලිකත්වයෙන් සිදු වෙයි. තරුණයකු සඳහා සුදුසු තරුණියක සෙවීමේ කාර්යය ද ඔහුගේ දෙමාපිය වැඩිහිටියන්ට සමාජ සම්මතයෙන් ම පැවරී ඇති යුතුකමකි. සාම්ප්‍රදායික මලයාසියානු සමාජයේ පෞද්ගලිකත්වයට වඩා සාමූහිකත්වය මුල් තැන ගැනීම විවාහ සංස්ථාව තුළින් ද මතු වී පෙනෙන්නකි. පුද්ගලයාගේ විවාහය මුළු පවුලේම සමාජ තත්වය කෙරෙහි බලපාන්නක් බැවින් සුදුසු විවාහයක් චාරිත්‍රානුකූල ව උත්සවාකාරයෙන් සිදු කිරීම වැඩිහිටියන්ගේ පරම චේතනාව විය. විවාහ යෝජනාවක් සඳහා කැමැත්ත පළ කිරීමට පෙර ඥාතීන්ගේ අදහස් විමසීම වැදගත් සේ සැලකෙයි. පුද්ගලයාගේ විවාහය පවුල කෙරෙහි මෙන් ම ඥාති සමූහයා කෙරෙහි ද බලපෑම මෙවැනි අවශ්‍යතාවකට මග පෑදූ බව සිතිය හැකිය. සාමූහිකත්වය අගය කළ

පුළුල් නෑ සබඳතා පැවති මලයාසියානු සමාජය තුළ මෙබඳු ලක්ෂණ දක්නට ලැබීම පුදුමයක් නොවේ. විවාහ මංගල්‍යෝත්සවයක් ඥාතීන් අතර මෙන් ම අසල්වැසියන් අතර ද සුහදතාව, සාමූහිකත්වය වර්ධනයට තුඩු දෙන අවස්ථාවක් ලෙස ද සැලකිය හැකිය. නිදසුනක් ලෙස මලක්කා ප්‍රාන්තයෙහි වැසියන් අතර පැවති සිරිතක් දැක්විය හැකිය. ගැමියන් අතුරෙන් එක් අයකුගේ නිවසේ සිදු වන විවාහ උත්සවයට අවශ්‍ය ආහාර පාන හා වෙනත් භාණ්ඩ අසල්වැසියන් එකිනෙකාගෙන් තෑගි වශයෙන් ලැබෙයි. අනික් තැනැත්තකුගේ නිවසේ විවාහ උත්සවයක් පැවැත්වෙන විට ද එම චාරිත්‍රය අනුගමනය කෙරෙයි. පුද්ගලයන්ගේ අවශ්‍යතාවල දී සාමූහික වශයෙන් ලැබෙන සහයෝගය මෙහි වැදගත් ලක්ෂණයකි.

මලයාසියානු සංස්කෘතියේ විවාහ සංස්ථාව තුළින් මතු වී පෙනෙන තවත් සමාජ ආකල්ප ඇත. පෙරදිග සමාජයක් ලෙසට මලයාසියානු සමාජය ද සදාචාරය රැකීමේ කර්තව්‍යය වැඩි වශයෙන් ස්ත්‍රියගෙන් අපේක්ෂා කරයි. විවාහ යෝජනාවක දී ස්ත්‍රිය විෂයෙහි එම සුදුසුකම බල පෑ අතර පුරුෂයා වෙතින් එය අපේක්ෂා කිරීම විරල වශයෙන් සිදු විය.[24] ස්ත්‍රියගේ යහපත් පැවැත්ම, සදාචාරය සෙසු සුදුසුකම් අතරට එක් වී තිබුණි.

විවාහ යෝජනාවකට පෙර තරුණ තරුණියන්ගේ සුදුසුකම් විමසා බැලීමේ දී ද පවුල් සංස්ථාව සංවිධානාත්මක ව පැවැත්වීම, සමගිය, සාමූහිකත්වය වර්ධනය වීම මෙන් ම සමාජයේ පොදු යහපත ද අපේක්ෂා කළ ආකාරය පෙනෙයි. සම්ප්‍රදායානුකූල වීම, සංවර බව හා යහපත් පැවැත්ම වැනි මලයාසියානු සංස්කෘතියේ කැපී පෙනෙන ලක්ෂණ විවාහ සංස්ථාව තුළින් ද මතු වී පෙනේ.

මලයාසියානු විවාහ චාරිත්‍ර සලකා බලන විට විවිධ ප්‍රාන්තවල දක්නට ලැබෙන විශේෂ සිරිත් විරිත් ඇති නමුදු ඒ අතුරෙන් පොදු ස්වභාවය ද මතු වී පෙනේ. විවාහයක් සිදු වෙතොත් එය චාරිත්‍රානුකූල ව, උත්සවාකාරයෙන් සිදු විය යුතුය යන්න මලයාසියානු සමාජයේ පවත්නා පොදු විශ්වාසයයි. විවාහ උත්සවයක උත්කර්ෂවත් බව අදාළ පුද්ගල යන්ගේ වත්කම් ප්‍රමාණය මත රඳා පවතී යන්න ද එවැනි පොදු හැඟීමකි. එකිනෙකට සම්බන්ධ වන පවුල්වල සාමාජික තත්වය පිළිබිඹු වීමක් ලෙසින් ද එවැනි අවස්ථා සැලකෙයි. විවාහ උත්සව පොදුවෙ ගෙන බලන විට මලයාසියානු සංස්කෘතියේ කැපී පෙනෙන සාමූහිකත්වය තහවුරු කරලීමේ පරමාර්ථය ද ඒ තුළින් මතු වී පෙනේ.

මලයාසියානු සමාජයේ සම්ප්‍රදායානුකූල ව සිදු කෙරන විවාහය ඉතා දීර්ඝ හා සවිස්තර ක්‍රියා මාලාවකින් සමන්විතය. දෙමාපිය වැඩිහිටියන්ගේ බලපෑමෙන් මිදී පුද්ගලයා ස්වාධීනත්වය ලබන අවස්ථාවක් සේ ගැනෙන විවාහය පුද්ගලයාගේ ජීවිතයේ සන්ධිස්ථානයක් සේ සැලකීම ද අර්ථවත් වන්නේය.

විවාහ චාරිත්‍ර ඉටු කිරීමේ දී ද මෙම ජාතිකයන් සතු විවිධ ඇදහිලි විශ්වාස ඒ හා සම්බන්ධ වී පවතී. නිදසුනක් ලෙස ගතහොත් විවාහ වන අවස්ථාවට මනාලිය සූදනම් කරවීම සඳහා ඉටු කෙරෙන සිරිත් විරිත් එබඳු විශ්වාස පදනම් කරගෙන පවතී. විවාහයට ප්‍රථම මනාලියගේ හිස කෙස් හා නිය කොට කර කැපීම, දත් පිරිසිදු කිරීම, ආලේප ගෑම යනාදිය විවාහයේ දී ඇයට සිදු විය හැකි භූත දෝෂ දුරු කර ලීමේ අභිප්‍රායෙන් කරනු ලබන දේවල්ය. අපිරිසිදු දත්වලට භූත බැල්ම පහසුවෙන් එල්ල විය හැකිය. 'හෙනා' (henna)[25] නමැති පැලැටියෙන් තනා ගත් වර්ණාලේපයත් ඊට පෙර කරනු ලබන සහල් පිටි ආලේපයත් මෙම පරමාර්ථ අනුව සිදු කරන දේය. 'හෙනා' ආලේපය මනාල යුවලට ම පොදුවේ කරනු ලබන්නකි. මලක්කා වැනි පෙදෙස්වල විවාහයට පෙර තුන් දිනක මෙම වර්ණාලේප චාරිත්‍රය සිදු කෙරේ.

විවාහප්‍රාප්ත වන තරුණයා මෙන් ම තරුණිය ද ඉතා අලංකාර ලෙස සැදී පැහැදී සිටීම අවශ්‍යයෙන් ම අසුභ දෝෂ, භූත බැල්ම දුරු කර ලීමට හේතු වේ යයි මලයාසියානු ජාතිකයෝ අදටත් වඩා අතීතයේ දී තරයේ ම විශ්වාස කළහ. වර්තමාන සමාජයෙහි පවා 'බර්සංඩිං' චාරිත්‍රය මනාල යුවල ඉතා අලංකාර ලෙස සැදී පැහැදී සිටීමට යොමු කරන අවස්ථාවකි. 'එක් දිනකට රජු හා බිසව' ලෙස මනාල යුවලක් පෙනී සිටින අවස්ථාවක් ලෙසින් සැලකෙන මෙය විවාහ මංගල්‍යෝත්සවයක ප්‍රධානතම, දැකුම්කලු ම වැදගත් ම අවස්ථාව ද වන්නේය. මෙම අවස්ථාවට ගැළපෙන පරිදි මනාලිය වෙස් ගැන්වීම සඳහා 'මක් අන්දම්' (Mak Andam) නමින් හැඳින්වෙන පළපුරුදු ස්ත්‍රියක් පත් කරනු ලැබේ. වැන්දඹු හෝ දික්කසාද ස්ත්‍රියකගේ විවාහයේ දී මෙම චාරිත්‍ර ඉටු නොකෙරේ.

වර්තමාන මලයාසියානු සමාජය තුළ විවාහයක් සිදු කිරීමේ දී බොහෝ දුරට තහවුරු ව පවතින එක් අංශයක් නම් ආගමික අංශයයි. විවාහප්‍රාප්ත වන යුවලට ආගම සිහිපත් කරවීම අවශ්‍යයෙන් ම සිදු වන්නකි. විවාහය සිදු කිරීම 'කාදි' (kadi) හෝ 'ඉමාම්' (Imam) නමින් හැඳින්වෙන ආගමික පූජකවරයකුගේ ප්‍රධානත්වයෙන් සිදු වෙයි. සාක්ෂි කරුවන් දෙදෙනකු ද මනාලියගේ භාරකරු ලෙස තවත් පිරිමියකු ද මනාල යුවල ද පූජකවරයා ඉදිරියේ පෙනී සිටිමින් ආගමික ගීතිකා ගායනයෙන් ද යුක්ත ව විවාහය සිදු කෙරේ. විවාහය සිදු කරන දිනයට පෙර දින කරනු ලබන වර්ණාලේප චාරිත්‍රය ඉටු කිරීම සඳහා ද ආගමික ගීතිකා ගායනය සිදු කෙරේ. මේ අනුව සාම්ප්‍රදායික මලයාසියානු සිරිත් විරිත් පරිදි විවාහය චාරිත්‍රානුකූල ව මෙන් ම ආගමානුකූල ව ද සිදු කෙරෙන්නක් බවට පත් වී ඇත.

පොදුවේ සලකා බලන විට විවාහය මලයාසියානු ජාතිකයන් අතර ජාතියේ ඉදිරි ගමනට, සමෘද්ධියට, හා සෞභාග්‍යයට යොමු කෙරෙන අවස්ථාවකි. විවාහ උත්සවයට සහභාගි වන්නවුන්ට ආහාර පානවලින් කෙරෙන සංග්‍රහවලට අමතර ව තම්බන ලද බිත්තර වර්ණවත් ව මලක් වැනි සැරසිල්ලක් මත තබන ලදු ව (Bunga telor) අමුත්තන්ට එක් බිත්තරය බැගින් දෙනු ලැබේ.[26]

මලයාසියානු සමාජය මුතුන් මිත්තන් ගරු කිරීම, සම්ප්‍රදායානුකූල ව සිතීමට යොමු වීම, සාම්ප්‍රදායික චාරිත්‍ර චාරිත්‍ර ඉටු කිරීමට ඇති ප්‍රවණතාව යන මේ ලක්ෂණ එම සංස්කෘතිය තුළින් මතු වී පෙනෙයි. විවාහ උත්සවයේ දී විශේෂයෙන් ම 'බර්සංඩිං' චාරිත්‍රය සිදු කරන අවස්ථාවේ දී මනාල යුවල සාම්ප්‍රදායික මලයානු ඇඳුම් පැළඳුම් ඇඳ පැළඳ සිටිය යුතු බව අද පවා පිළිගනු ලැබේ. මනාලිය අඳින 'බාජු' ඇඳුම් කට්ටලය සමග ඔටුන්නක හැඩයට සමාන රනින් හෝ රිදියෙන් කළ හිස් පළඳනාවක් හා වෙනත් ආභරණ ද පැළඳ සිටිය යුතුය. මනාලයා ද දිග කමිසය, කලිසම සහ ඊට උඩින් දණිස් තෙක් වැටෙන සේ ඉණ වටේ අඳින රෙද්ද සහ විශේෂයෙන්ම සාම්ප්‍රදායික මලයානු හිස් වැස්ම ( Songkok ) ද ඇඳ පැළඳ ගෙන සාම්ප්‍රදායික මලයානු ආයුධයක් වන කිරිච්චිය (Keris) ඉණේ ගසා ගෙන සිටිය යුතුය. ඔහුගේ මෙම අලංකාරවත්, වර්ණවත් ඇඳුම් කට්ටලය සමග සිහසුන අරා සිටින රජකු මෙන් පෙනී සිටී යයි විශ්වාස කෙරේ.

මලයාසියානු සංස්කෘතික ලක්ෂණයක් සේ මතු වී පෙනෙන සම්ප්‍රදායානුකූල වීම විවාහ උත්සවවල දී සිදු කෙරෙන අනිකුත් චාරිත්‍රවලින් ද හෙළිවෙයි. විවාහප්‍රාප්ත යුවල සහ රැස් වී සිටින පිරිස ඉදිරියේ පැවැත්වෙන සාම්ප්‍රදායික කලා සන්දර්ශන මෙහිලා දැක්විය හැකි එක් නිදසුනකි. ආත්මාරක්ෂාව සඳහා පුරුදු පුහුණු කරවනු ලබන 'සිලත්'

(Silat) නම් සන්දර්ශනය මෙහි මුල් තැනක් ගනී. යුවලට සුභ පැතීම මෙන් ම ගෞරවාචාර දැක්වීම ද මෙහි ගැබ් ව ඇති අර්ථයයි. විවා මඟුල සිදු වූ දින රාත්‍රියේ භෝජන සංග්‍රහයට පසුව අමුත්තන් වෙනුවෙන් පැවැත්වෙන අනිකුත් දර්ශන අතර මලයාසියානු සංස්කෘතියේ සාම්ප්‍රදායික කලාවක් වන ඡායා රංග (Shadow play) වැදගත් තැනක් ගනී. හින්දු සංස්කෘතික බලපෑමේ එක් අවස්ථාවක් කියා පාන මෙම රංගන සඳහා සන කඩදාසියෙන් හෝ තුනී තහඩුවලින් සැදූ රූකඩ තිරයකට පිටුපසින් තබා එහි සෙවනැලි මගින් රංගනය ප්‍රදර්ශනය කෙරේ. රාමායණය වැනි ග්‍රන්ථවල අන්තර්ගත කථා පුවත් විෂය කර ගත් මෙම ඡායා රංග විශේෂය මලයාසියානු සමාජයේ සාම්ප්‍රදායික කලාවක් ලෙස පැවත ආවකි. කෙසේ නමුදු කාලයාගේ ඇවෑමෙන් වර්තමාන සමාජයේ භාවිතයෙන් බැහැර ව යමින් පවතින මෙම සාම්ප්‍රදායික කලා මලයාසියාවේ ඇතැම් ප්‍රාන්තවල අද පවා විවාහ මංගල්‍ය උත්සවවල දී ප්‍රදර්ශනය කරනු දක්නට ලැබේ.

මලයාසියානු සංස්කෘතිය මුතුන් මිත්තන්ට හා සම්ප්‍රදායට ගරු කිරීමේ ආකල්පය ජනයා තුළ වර්ධනය කිරීමේ නැඹුරුවක් හෙළි කරන අතර පොදුවේ වැඩිහිටියන්ට අවනතභාවය හා ඔවුන්ට සැලකීම ගැන ද ජනතාව උනන්දු කරවීමක් දක්නට ලැබේ. විශේෂයෙන් ම පවුල් සංස්ථාව තුළ බිරිය සැමියාට දක්වන අවනතභාවය මෙන් ම ලේලිය නැන්දම්මාට අවනත විය යුතුය යන්න ද අවශ්‍යයෙන් ම සලකනු ලබන්නකි. දීග විවාහ ක්‍රමය වඩාත් ප්‍රචලිත ව පැවතුණ අතර විවාහක යුවල සැමියාගේ දෙමාපියන් සමග එක නිවසේ ජීවත් වීම් ද බහුල ව සිදු වූවකි. මනාලියගේ නිවසේ දී පැවැත්වෙන චාරිත්‍රානුකූල උත්සවවලින් ඇතැම් ඒවා යුවල මනාලයාගේ නිවසට ගිය පසු නැවත වරක් එහි දී ද සිදු කෙරේ. මංගල වේදිකාව මත හිඳ සිටීමේ චාරිත්‍රය එසේ නැවත වරක් පවත්වනු ලබන්නකි. මනාලයාගේ දෙමාපියන් ඇතුළු ඥාති පිරිසට මනාලිය හඳුන්වා දීමට අවශ්‍ය අවස්ථාවක් සේ මෙය සැලකේ. මනාලයාගේ නිවසේ දී මනාලිය සැරසීම හා හැඩ වැඩ ගැන්වීම නැන්දම්මා අතින් සිදු වෙයි. ලේලිය ඊට ඉඩ දී සිටීම නැන්දම්මා ඇතුළු වැඩිහිටියන් වෙත මනාලියගේ අවනතභාවය සංකේතවත් කරයි.

මේ අනුව මලයාසියානු විවාහ චාරිත්‍ර තුළින් මතු වී පෙනෙන සංස්කෘතික ලක්ෂණ අතර ඉස්මතු වී පෙනෙන කරුණු කිහිපයකි. විවාහය විෂයෙහි දෙමාපිය වැඩිහිටි වගකීම හා ඔවුන්ගේ අනුමතිය වැදගත් වෙයි. විවාහ උත්සව සිදු කිරීමේ දී සම්ප්‍රදායානුකූල වීම, චාරිත්‍රානුකූල ව විවාහය සිදු කිරීම, වැඩිහිටි ගෞරවය හා අවනතභාවය මෙන් ම සාමූහිකත්වය අගය කිරීම ද ඉස්මතු වී පෙනේ. විවාහය උතුම් අවස්ථාවක් සේ සලකනු ලබන අතර ඒ අනුව විවාහප්‍රාප්ත වන යුවලට ගෞරව දැක්වීම අවශ්‍ය සේ සැලකේ. විවාහක යුවල ජීවිතයේ වැදගත්, වගකිව යුතු තත්වයකට පත් වී ඇත යන හැඟීම ඔවුන් තුළ වර්ධනය කිරීම ද මෙම ක්‍රියාවන්හි එක් පරමාර්ථයකි. ආගමික ඉගැන්වීම් මෙම සියලු කාර්‍යයන්හි දී වැදගත් සේ සැලකෙනේනේ වර්තමාන සමාජයේ පවා ප්‍රබල ව පවත්නා ඉස්ලාම් සංස්කෘතික ලක්ෂණ තව දුරටත් තහවුරු කර ලීමේ අභිලාෂයෙනි. ආගමික අංශය සමග ම විවිධ ඇදහිලි විශ්වාස ද විවාහ චාරිත්‍ර විෂයෙහි ලා ක්‍රියාත්මක වනුයේ ඉහත දැක්වූ පරිදි මලයාසියානු සංස්කෘතිය ඉදිරියට ආ දීර්ඝ ගමනේ දී ලැබූ විවිධ බලපෑම් තව දුරටත් නොනැසී පවතින බව ද ප්‍රකට කරවමිනි.

මලයාසියානු සංස්කෘතිය තුළ පුද්ගලයාගේ ජීවිතයේ අවසාන අවස්ථාව වන මරණය පිළිබඳ ඉටු කෙරෙන චාරිත්‍ර වාරිත්‍ර ද ඒ හා බැඳුණ සමාජ ආකල්ප ද ඇත. වර්තමානයේ විශේෂයෙන් ම මෙම අවස්ථාව ඉස්ලාම් සංස්කෘතික ලක්ෂණ කියා පාමින් ආගමික මුහුණුවරක් ගනු ලබන අතර ඇදහිලි විශ්වාස රැසක් ද ඊට සම්බන්ධ වී පවතින අයුරු පෙනේ. සමාජය තුළ වර්ධනය විය යුතු සේ සැලකෙන ගුණාංග ලෙස අන්‍යොන්‍ය ගෞරවය, සුහද බව හා සාමූහිකත්වය අවමංගල චාරිත්‍ර විෂයෙහි ද මුල් තැන ගනී.

ඉස්ලාම් ආගමික ඉගැන්වීම් අනුව කෙනකු මිය ගිය විට ඉතා ඉක්මණින් භූමදාන කළ යුතු වන්නේය. මළමිනිය පිරිසිදු කිරීම සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් යොමු වීම ද මෙහි පෙනෙන තවත් ලක්ෂණයකි. ආගමික ඉගැන්වීම් හා ඇදහිලි විශ්වාස අභිනත ගෙන, සමාන්තර ව ක්‍රියාත්මක වන බව අවමංගල්‍ය චාරිත්‍රවලින් ද හෙළි වන අවස්ථා ඇත. සෝද පිරිසිදු කර ඇඳුම් ඇන්දවූ මළ මිනිය මත ගිරයක් තැබීම අවශ්‍ය ලෙස සැලකේ. භූතයන් මිනිය ඉහළින් යාම වළක්වන සේ එසේ කළ යුතු බවට පවත්නා මෙම විශ්වාසය ද ඉහත දැක්වූ ඇදහිලි විශ්වාස හා බැඳී පවතී.

මළවුන්ට ගෞරව දැක්වීම මලයාසියානු සංස්කෘතියේ කැපී පෙනන ලක්ෂණයකි. මිනිය නිවසේ තිබෙන තුරු කිසිවකු ශබ්ද නගා කතා බහ පවා නොකළ යුතු සේ සැලකෙන්නේ එමඟින් මිය ගිය තැනැත්තාට ගෞරව දැක්වීමේ අපේක්ෂාවෙනි. භූමදාන කරන මොහොතේ කිසිවකු විසින් මෘත දේහයේ කණට කොඳුරා ආගමික පාඨ කිව යුතුයි. කෙනකු මිය ගොස් දින තුන, හත, දහතර හතළිහ සහ සියය ගෙවෙන දිනවල භෝජන සංග්‍රහ පැවැත්වීම පශ්චාත් අවමංගල්‍ය චාරිත්‍ර ලෙස සැලකේ. මිය ගිය අය ගෞරවයෙන් යුතුව සැමරීම මෙන් ම අසල් වැසියන් සමග තම ශෝකය බෙදා ගැනීමක් සේ මෙම භෝජන සංග්‍රහ පැවැත්වීමේ චාරිත්‍රය දැක්විය හැකිය. සමාජය තුළ වර්ධනය විය යුතු සේ සැලකෙන ගුණාංග ලෙස අන්‍යෝන්‍ය ගෞරවය හා සැලකිල්ල, සුහද බව හා සාමූහිකත්වය අවමංගල්‍ය චාරිත්‍ර විෂයෙහි ද මුල් තැන ගනී.

මේ අනුව පොදුවේ සලකා බලන විට වෙනත් පෙරදිග සාම්ප්‍රදායික සමාජ මෙන් මලයාසියානු සමාජය ද වර්තමානයේ සිදු වන සමාජ විපර්යාසය අතරින් වුව ද සම්ප්‍රදාය ආරක්ෂා කර ගැනීමෙහි ලා මෙන් ම සමාජ සංවිහිතතාව රැක ගැන්මෙහි ලා ද නැඹුරු ව පවතින බව පෙනේ.

1. Aziz Deraman, *The Development of Culture, Communication and Education in Malaysia*, Cultural Division, Ministry of Culture, Youth and Sports, Malaysia, 1983, p.1

2. එම, 4 පිට.

3 මලයා අර්ධ ද්වීපයට ඉන්දියානු බලපෑම ක්‍රි. ව. 2 වන ශත වර්ෂයේ පමණ සිට සිදු වූ බව ඇතැම් ලේඛනවල සඳහන් වන නමුදු මෙය මත භේද සහිතය, එකල සිට ඉන්දියානු ජනයා මලයාවට පැමිණෙන්ට ඇති නමුදු ප්‍රබල සංස්කෘතික බලපෑමක් සිදු නොවූවා විය හැකිය.

4. S. Arsaratnam, *Indians in Malaysia and Singapore*, Kuala Lumpur, 1979, p.5

5. Richard Winstedt, *The Malays - A Cultural History*, London, 1972, p.26

6 එම, 46 පිට

7. මනාල යුවල ගෞරවාචාර පිළිගැනීම සඳහා මංගල වේදිකාව මත අසුන් ගෙන හිඳ සිටීමේ චාරිත්‍රය (Bersanding)

8. විවාහාපේක්ෂක යුවල අතුරෙන් කෙනකු අන් ආගමික යකු වෙතොත් ඔහු හෝ ඇය ඉස්ලාම් භක්තිය වැළඳ ගැනීමෙන් එම බාධකය ජය ගෙන විවාහය සිදු කෙරෙන අවස්ථා දක්නට ලැබේ.

9. *The Malays - A Cultural History*, p.1

10. Haji Mohtar bin H.Md. Dom., *Malay Superstitions and Beliefs*, Kuala Lumpur, 1979, pp. 5, 6

11 එක්තරා අවස්ථාවක දේවස්ථානයේ පැවති සන්ධ්‍යා යාඥාවට නොගොස් නිවසේ රැඳී සිටි මලයාසියානු ඉස්ලාම් භක්තිකයකු එසේ කිරීමට හේතුව විමසා බැලීමේ දී හෙළි වූ කරුණක් මීට නිදසුන් සපයයි' සිය නිවසේ සිට දේවස්ථානයට යන අතර මග ඇති දිය කඩිත්ත හා උණ පඳුර අසල ඇතැයි විශ්වාස කරනු ලැබූ භූතයාට බියෙන් යාඥාවට නොගිය එම තැනැත්තා තුළ යාඥා නොකිරීම වෙනුවෙන් දෙවියන්ට ඇති බියට වඩා භූත බලපෑමට ඇති බිය ප්‍රබල ව නැගී ආ අයුරු පෙනේ.

12. *Malay Superstitions and Beliefs*, p.14

13. එම 19 – 21 පිටු

14. Haji Mohtar bin H. Md. Dom, *Traditions and Taboos* Malaysis, 1979, p.5

15. මෙම කාල සීමාව තුළ මව දුර බැහැර ගමන් නොයාම (සාම්ප්‍රදායික සමාජයේ නම් නිවසින් පිට නොයාම) ඇතැම් ආහාර පානවලින් වැළකී සිටීම යනාදිය තහංචි ලෙස සැලකුණි,

16. සාම්ප්‍රදායික සිංහල සමාජයේ වුව ද ප්‍රසූතියෙන් පසු ටික දිනක් ගෙවෙන තුරු මවකට දෙනු ලබන ආහාර පාන ගැන මීට සමාන ආකල්පයක් පැවතුණි. ආහාරවල පෝෂ්‍යදායී ගුණාගුණ සලකනු වෙනුවට භූත විශ්වාස හා වෙනත් මිථ්‍යා විශ්වාසවලට සම්බන්ධ කොට පිළිපදිනු ලැබූ තහංචි ලෙස මේවා සැලකිය හැකිය.

17. *The Malays - A Cultural History*, p.28

18. Haji Mohtar bin H. Md. Dom, *Malay Wedding Customs*, Federal Publications, Kuala Lumpur, 1979, p. 7

19. *Malay Wedding Customs*, p. 7.

20. *Malay Superstitions and Beliefs*, p. 32

21. "Marriage in Islam is strongly recommended on religious, moral, social, psychological and physiological grounds." Muhammad Abdul Rauf, *Marriage in Islam*, New York, 1977, p. 13.

22. "Marriage is my recommended custom. Whosoever turns away from my recommended custom is turning away from me" *Marriage in Islam*, p. 13

23. 'බර්සංඩිං' (Bersanding) නමින් හැදින්වෙන මනාල යුවල ගෞරවාචාර ලැබීම සඳහා මංගල වේදිකාව මත අසුන් ගෙන සිටීමේ චාරිත්‍රය මීට නිදසුනකි,

24. පෙරාක් ප්‍රාන්තයේ විවාහ යෝජනාවක දී සුචරිතය පිළිබඳ සුදුසුකම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය වෙතින්ම සොයා බලනු ලැබේ

25. "Egyptian privet, its shoots and leaves used as a dye"; The coneise oxford Dictionary, Edited by H. W. Fowler and F. G. Fowler, Oxford, 1964.

26. *Social and Cultural Practices in Malaysian Society* Published by the Board of National Unity, Prime Minister's Dept. with the co-operation of the Information Department Malaysia, 1974, p.6